2021

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report





නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
நகரக் குடியிருப்பு அபிவிருத்தி அதிகாரசபை
Urban Settlement Development Authority

www.usda.gov.lk

SCAN to access full Integrated Annual Report

පටුන

03 සභාපතිතුමාගේ සමාලෝචනය

05 අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

06 උපදේශක කමිටු සමාලෝචනය

07 විගණන හා කළමනාකරණ කමිටුවේ සමාලෝචනය

08 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

09 උපදේශක කමිටු සංයුතිය

10 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන නිලධාරී මණ්ඩල

13 භෞතික සංවර්ධන වැඩසටහන

14 නිවාස ව්‍යාපෘති පෙලගැස්ම හා ප්‍රගතිය

20 නාගරික අඩු ආදායම්ලාභී සහ මැදි ආදායම්ලාභී ප්‍රජාව සඳහා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය ඉඩම් හඳුනා ගැනීම

30 නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ඔප්පු ලබාදීම්

31 මානව සංවර්ධන වැඩසටහන

48 2021 ලෝක ජනාවාස දින සැමරුමට සමගාමී වැඩසටහන්

50 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි අභ්‍යන්තර අරමුදලක් පිහිටුවීම

53 මානව සම්පත් සංවර්ධන සහ ආයතන කළමනාකරණය

57 අධිකාරිය සඳහා නව අයකිරීම් අංශයක් ඇතිකිරීම

61 මාසික ධර්ම දේශනා වැඩසටහන

60 2021 ලෝක ජනාවාස දින සැමරුමට සමගාමී වැඩසටහන්

62 අධිකාරියහි කාර්යක්ෂමතාව උපරිම අයුරින් පවත්වාගැනීම සඳහා පුරප්පාඩුව පැවති කාර්යය මණ්ඩලය බඳවා ගැනීම

65 මූල්‍ය ප්‍රකාශන

90 රජයේ විගණන වාර්තාව



දැක්ම

“සාඩම්බර ජීවිතයක් උදෙසා තිරසාර නාගරික ජනාවාස ගොඩනැගීම”

මෙහෙවර

“සුසැදි සංයුක්ත හා සුරැකි බව රැඳුනු නාගරික ජනාවාස ගොඩනැගීම සහ භෞතික සාමාජීය සහ ආර්ථික වශයෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම”

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථ

- සෑම නාගරික ප්‍රදේශයක් සඳහාම සැලසුම් සහගත සංයුක්ත නාගරික ජනාවාස ඇති කිරීම.
- නාගරික ප්‍රජාවන්ගේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය වැඩිදියුණු කිරීම.
- නාගරික ප්‍රජාවන් තුළ දේපල හිමිකාරිත්වය පිළිබඳව හැඟීමක් ඇති කිරීම.
- අධිකාරියෙහි කාර්ය සාධනය විශිෂ්ටත්වයට පත් කිරීම.
- ස්වයං අරමුදල් සහිත ආයතනයක් බවට පත්වීම.



සභාපතිතුමාගේ සමාලෝචනය

එම්. එල්. සම්පත් සුබසිංහආරච්චි
සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා නිවාස ඇතුළු භෞතික පරිසරය, සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගත වෙමින් එම ප්‍රජාවගේ නිවාස ගැටළුව විසඳීම හා ඔවුන්ව සමාජ, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් බල ගැන්වීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වේ.

එම අරමුදල මඟින් ආයතනය එක් දිශාවකින් ශක්තිමත් කිරීම හා අනෙක් අතට ආයතනය මහා භාණ්ඩාගාරය මත නොයැපෙන ස්වාධීන ආයතනයක් බවට පත් කිරීම අපගේ අනාගත ඉලක්කය වන අතර, එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය මහත් කැපවීමකින් ක්‍රියා කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මුහුණු දුන් විශාල ගැටළුවක් වුයේ ඉඩම් නොමැතිකමයි. එම තත්ත්වය මැනවින් තේරුම් ගෙන, තැපැල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඌණ උපයෝගී තැපැල් කාර්යාල පරිශ්‍ර සඳහා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් ඇති කර ගැනීම වෙනුවෙන් කැබිනට් අනුමැතීන් ලබා ගැනීමට හැකිවීම අප ලද තවත් විශිෂ්ට ජයග්‍රහණයකි.

තවද ඒ අනුව මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී රාජ්‍ය පුද්ගලික ව්‍යාවසායකත්වය යටතේ මධ්‍යම ප්‍රාන්තික නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීම අපගේ අධිෂ්ඨානය වූ අතර ඒ අනුව ගමන් කරමින් වත්තල වැලිසර නිවාස ඒකක 408 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම් ආරම්භ කිරීමේ මුල් පියවර සනිටුහන් කර ගැනීමට 2021 වර්ෂයේ අප හට හැකියාව ලැබීම ද අප ලද සුවිශාල ජයග්‍රණයකි.

නව ව්‍යාපෘතීන් සඳහා හඳුනාගත් ඉඩම්වල ඉදිරි කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී.

- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ තැපැල් කාර්යාල පරිශ්‍රය ඉඩම
- කඩුවෙල තැපැල් කාර්යාල පරිශ්‍ර ඉඩම
- නිට්ටඹුව ඔර්චඩ්වත්ත නිවාස ව්‍යාපෘතිය
- අතුරුගිරිය සදාසිරිපුර ඉඩම

මෙයට අමතරව මහා භාණ්ඩගාර ප්‍රතිපාදන මත අඩු ආදායම් පවුල් සඳහා හික්කඩුව තුඩුවේගොඩ නිවාස ඒකක 32ක් සඳහා සහ නාවලපිටිය නිවාස ඒකක 83 ක් සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන මෙම වසරේ දී අනුමත වී ඇත.

මෙම ජයග්‍රහණවලට අමතරව මෙම ආයතනය ආරම්භයේ සිට සිදු කර ගැනීමට නොහැකි වී තිබූ කාර්ය මණ්ඩල ශ්‍රේණිගත කිරීම් සිදු කර අවසාන කිරීමෙන් ඔවුන්ට සතුටුදායක මානසික වටපිටාවක් ආයතනය තුල ගොඩනැගීමට හැකියාව ලැබීම ද සතුටට කරුණකි.

තවද කාර්තුමය සේවක ඇගයීම් ආරම්භ කරමින් මානව සම්පත් සංවර්ධන විෂයෙහිලා මනා කාර්ය සාධනයක් ඇති කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන ලදි. ආයතනයේ තිබූ මානව සම්පත් පුරප්පාඩු පිරවීමට 2021 වර්ෂයේ දී හැකියාව ලැබුන අතර, ඒවායින් ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට හැකියාව ලැබීම ද අප ලද භාග්‍යයකි.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාත්මික ගුණවගාව සංවර්ධනය කිරීම උදෙසා සෑම මසකම පොහෝ දිනට පෙර දින ගරුතර ස්වාමීන් වහන්සේ නමක් වඩමවා ගෙන ධර්ම දේශණයන් පවත්වන්නට කටයුතු කරන ලද අතර, එමඟින් කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකුගේ මානසික ඒකාග්‍රතාවය හා සංයමය සමඟ අධ්‍යාත්මික

සංවර්ධනය ඇති වීම තුළ ජනතා සේවය කෙරෙහි තවදුරටත් නැඹුරු වීමට ඇති කැමැත්ත නිරීක්ෂණය වීම ද අප ලද තවත් භාග්‍යයක් කොට සලකමි.

එමෙන්ම හැකි සෑම අවස්ථාවකම දී කාර්ය මණ්ඩලය සඳහා උපකාර වන දැනුම වර්ධන කරන පුහුණු වැඩසටහන් සඳහා නිරන්තරයෙන් අවස්ථා ලබා දීම සහ කොවිඩ් තත්ත්වය තුල තිබූ බාධක හමුවේ වුව ද යම් ප්‍රමාණයකට එම කටයුක්ත සිදු කිරීමට හැකි වූ බව ද සඳහන් කරමි.

ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන යටතේ තරුණ තරුණියන් සඳහා භාෂා දැනුම හා මෘදු කුසලතා වර්ධන කිරීමේ විශේෂ වැඩසටහන් සැලැසුම් කිරීමට හැකියාව ලැබීම මේ වසරේ අප වෙත පැවැරුණු තවත් වගකීමකි.

ගරු රාජ්‍ය අමාත්‍ය අචාර්ය නාලක ගොඩහේවා මහතාගේ උදාර සංකල්පයක් අනුව මෙම වැඩසටහන සඳහා දිරිගන්වන සුළු කාර්යභාර්යක් 2021 වර්ෂයේ දී සිදු කරන ලද අතර, එම වැඩසටහන දීප ව්‍යාප්තව සිදු කිරීම සඳහා මේ වන විට සියළු කටයුතු සුදානම් කර ඇත.

තවද සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන කර්මාන්තකරුවන් දිරිගැන්වීම සඳහා මේ වසර තුළ අප්‍රේල් හා දෙසැම්බර් මාසවල වෙළඳ ප්‍රදර්ශන 02ක් සංවිධානය කරන ලද අතර, එම ව්‍යවසායකයින් සඳහා අත්වැලක් වන්නට ස්වයං රැකියා ණය ආධාර ලබාදීමට ද අප කටයුතු කරන ලදි.

විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන සිදු කරන ව්‍යවසායකයින් දිරිගන්වමින් ඒ අය සඳහා අපනයන වෙළඳපොළ සහ දේශීය වෙළඳපොළ විවර කර දීම වෙනුවෙන් ශක්තියක් වීමට අප කටයුතු කරන අතර ස්වයං රැකියාවක් ලෙස කටයුතු කරන මෙවැනි ව්‍යවසායකයින් සඳහා ණය ආධාර ලබාදීම වෙනුවෙන් අප සමඟ මහජන බැංකුව ද මේ වසරේ දී ගිවිසුම් ගත වී අත්වැල් බැඳ ගැනීම ද විශේෂයෙන් සිහිපත් කරමි.

- මෙයට අමතරව,
- සෞභාග්‍යා ප්‍රජ ශක්ති
- සෞභාග්‍යා දිරිබල
- සෞභාග්‍යා නැණබල

සෞභාග්‍යා දිවිවරුණ යන වැඩසටහන් හරහා දිස්ත්‍රික්ක 16 ජනාවාස 27 ක ජීවත්වන දූ දරුවන්, මව්වරුන්/පියවරුන්, තරුණ/තරුණියන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වුවන් යන මේ සියළු දෙනා වෙනුවෙන් වැඩසටහන් රාශියක් සිදු කිරීමට හැකී වී ඇත.

කොඩිඩ් වසංගතය හමුවේ වුවද පැවැති නිරෝධායන ඇදිරි නීතිය කාලය තුළදී අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස සලකා අප කාර්ය මණ්ඩලය සෑම දිනකම සේවය කරන ලද අතර, නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් 2021 වසරේ එක් දිනක් හෝ කාර්යාලය වසා නොතිබීම සුවිශේෂ ලෙස සඳහන් කරනු කැමැත්තෙමි.

විනය ගරුක කාර්ය මණ්ඩලය සමඟ අල්ලස් හා දූෂණයෙන් තොරව ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයක් බවට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පත් කර ගනිමින් තවදුරටත් ජනතාවට බදු බරක් නොදෙමින් ස්වයං අරමුදල් සහිත ආයතනයක් බවට පත් කර ගැනීමේ අපගේ ඒකායන අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා සියළු දෙනා එකමුතුව එක්සිත්ව ක්‍රියාකරන බවද ඉතා සතුටින් දැනුම් දෙමි



අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

අධ්‍යක්ෂ ජනරාල්
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන හා කළමනාකරණ කමිටුව 2021 වර්ෂය තුළ දී රැස්වීම් 03ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වන පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරති.

සමන් ජයසිංහ මහතා
සාමාජික

ඊ. එම්. එන්. එදිරිසිංහ මහත්මිය - සාමාජික

එෆ්. එන්. සමානා සනූස් මෙනෙවිය
සාමාජික

නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ප්‍රජාවගේ නිවාස ගැටළු සඳහා විසඳුම් ලබා දීම හා ඔවුන්ව සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වේ. ඒ සඳහා භෞතික හා මානව සංවර්ධනය යන දෙවැදෑරුම් ප්‍රවේශයන් යටතේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

1971 අංක 38 දරණ මුදල් පනතේ 12 වැනි සහ 13.6 වැනි වගන්තිය ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබන සියලුම ගණුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර, ගිණුම් පොත් පවත්වාගෙන යාම, සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරිය වෙත පැවරී ඇත.

ඒ අනුව, නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වල දී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සෑම අවස්ථාවකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමටත්, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් සහ

ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සළකා බලා ඇත. අධිකාරිය සතු වත්කම් ආරක්ෂ කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වළක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත.

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂ කර ගැනීමට සහ එහි වාර්තාවන් හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන අභ්‍යන්තර පරීක්ෂා කිරීම, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනවලින් සමන්විත ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්



උපදේශක කමිටු සමාලෝචනය

2008 අංක 36 දරන නා.ජ.සං. අධිකාරී පනතින් 10 වන වගන්තිය ප්‍රකාරව උපදේශක කමිටුව පිහිටුවනු ලැබීය. ප්‍රමාණවත් ස්ත්‍රී පුරුෂ නියෝජනයක් ඇති බවට සහතික වෙමින් උපදේශක කමිටුව සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයින් 14 දෙනෙකුට වැඩි නොවන පිරිසකගෙන් උපදේශක මණ්ඩලය සමන්විත විය යුතු බව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ සඳහන් වී ඇත.

උපදේශක කමිටුවේ ධුර කාලය ලෙස පත් කරනු ලබන දිනයේ සිට අවුරුදු 03ක් විය යුතුය. උපදේශක මණ්ඩලය සඳහා පත් කරනු ලබන සාමාජිකයින් අතරින් කෙනෙකු සභාපතිවරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත් කළ යුතුය. මේ අනුව 2021 වර්ෂයේ සිට උපදේශක කමිටුවේ සභාපති ලෙස මහාචාර්ය රංගික හල්වතුර මහතා කටයුතු කරයි.

තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් සහතික කරනු පිණිස නාගරික ජනාවාස සංවර්ධනයට අදාළව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම උපදේශක මණ්ඩලයේ මූලික කර්තව්‍යයක් වශයෙන් දැක්විය හැකි අතර මීට අමතරව නාගරික ජනාවාසවල ජීවත්වන ජනතාවගෙන් ලැබිය හැකි යෝජනා සැලසුම් සැළකිල්ලට ගෙන නාගරික ජනාවාසවල ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා නා.ජ.සං අධිකාරිය විසින් සකස් කරනු ලබන සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩසටහන් සකස් කිරීම සඳහා අධිකාරිය විසින් උපදෙස් ඉල්ලා සිටින අවස්තාවක උපදෙස් ලබා දීම ද මෙහි සුවිශේෂී කාර්යභාරයක් ලෙස දැක්විය හැකිය.



විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය

අධ්‍යක්ෂ ජනරාල්
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි
විගණන හා කළමනාකරණ කමිටු ලේකම්
විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දීමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත විය. 01/2021 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, අධ්‍යක්ෂ - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ඇ.පී. විමලසේන මහතා කමිටු සභාපති ලෙස කටයුතු කළ අතර කේ. ඒ. එස්. වල්පොල මහත්මිය සහ නීතිඥ එෆ්. එන්. සමානා සතුස් මහත්මිය කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

2021-11-26 දින පැවති 06/2021 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, අධ්‍යක්ෂ මණ්ඩල සටහන් අංක 06/2021/භ-14 අනුව විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් ලෙස රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, සමන් ජයසිංහ මහතා කමිටු සභාපති ලෙසත්, අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වන ඊ.එම්.එන්. එදිරිසිංහ මහත්මිය සහ නීතිඥ එෆ්.එන්. සමානා සතුස් මහත්මිය කමිටු සාමාජිකයින් ලෙසත් පත්කරන ලදී. ඒ අනුව 2021-12-01 දින පැවති 02/2021 සහ 2021-12-28 දින පැවති 03/2021 කමිටු රැස්වීම්වල ඉහත නිලධාරීන් කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගි වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අංශ ප්‍රධානීන් හා අවශ්‍ය අවස්ථාවන්හීදී අනෙකුත් නිලධාරීන් රැස්වීම්වලට සහභාගි විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද 2021 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සලකා බලා නිර්දේශ කරන ලදී. විගණන වාර්තා, විගණන විමසුම්වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර හා බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසිකලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩි දියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදී. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ගනු ලැබූ තීරණවලට අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ගද සාකච්ඡා කරන ලදී.

සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.සාමාජිකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන්ද ඉතා අගය කොට සළකමි.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2021.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.



එම්. එල්. සම්පත් සුබසිංහආරච්චි මහතා
සභාපති



උදය නානායක්කාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල
ලේකම්



ආර්. දුමින්ද සිල්වා මහතා
අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික



නීතිඥ එෆ්.එන්. සමානා සනුස් මෙය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



පී. ඩබ්ලිව්. ලීලාරත්න මහතා
අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික



පී.ජී.එස්. මංජුල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික



ඩබ්ලිව්.ඒ. උදින පුෂ්ප කුමාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික



නීතිඥ චන්දිම දීපික පනාගොඩ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඊ.එම්.එන්. එදිරිසිංහ මිය
අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික



අජිත් වසන්ත ජයලාල් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල
සාමාජික



සමන් ජයසිංහ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

උපදේශක කමිටු සංයුතිය

2021.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුව පහත පරිදි වේ.



මහාචාර්ය රංගික හල්වතුර මහතා
සභාපති



එච්.බි.වි.ධමෙන්ද්‍ර මහතා
සාමාජික



කාලිංග තිලකරත්න මහතා
සාමාජික



එන්.ඩි.රුවන් කුමාර මහතා
සාමාජික



ජයන්ත කුමාර අතපත්තු
මහතා සාමාජික



ජේ.බි.ඇල්ලේපොල මහතා
සාමාජික



ආර්.ඒ.එස්.කේ.කුලරත්න
මහතා සාමාජික



ආර්.ජී.සී.පී.රණතුංග මහතා
සාමාජික



ආර්.ජී.ජී.දිනේෂ් මහතා
සාමාජික



ආර්.පී.සිල්වා මහත්මිය
සාමාජික



බී.ජී.ජයතිලක මහතා
සාමාජික



ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික



කේ.අනිල් වික්‍රමසිංහ මහතා
සාමාජික



කේ.එම්.ඩි.කේ.කරුණාදාස
මහතා සාමාජික



ජී.ඒ. එල්. එන්. අබේවික්‍රම
මහතා සාමාජික

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන නිලධාරී මණ්ඩලය



එම්.එල්. සම්පත් සුබසිංහආරච්චි
මහතා - සභාපති



වී. යූ. බී. නානායක්කාර මහතා
අධ්‍යක්ෂ ජනරාල්
(2021.07.12 දක්වා)



ප්‍රසන්න ජේ. වික්‍රමසූරිය මහතා
අධ්‍යක්ෂ ජනරාල්
(2021.12.30 සිට)



කේ.කේ.ඩබ්.ටී.පී. ද සිල්වා මිය
අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)



ඒ.ජී.එස්.එන්. නිශාන්ති මිය
අධ්‍යක්ෂ (මුදල්)



පී. එම්.ඒ. වීරක්කොඩි මිය
අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ



නලින් ගන්කන්ද මහතා
අධ්‍යක්ෂ (ඉංජිනේරු)



එස්. සුරංග මුණසිංහ මහතා
වැඩ බලන අධ්‍යක්ෂ (ඉංජිනේරු)/
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු
තාක්ෂණ හා මාධ්‍ය)



ඩී.ඒ. දේවිකා දිසානායක මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)



එල්.ආර්.ඒ. ශාන්ත මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(අභ්‍යන්තර විගණක)



ඒ. එම්. කේ. බී. අතාවුද මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්))/
(ණය අයකිරීම්/ ප්‍රවාහන හා නඩත්තු)



ඒ. පී. ආර්. ඥානප්‍රිය මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(මානව සම්පත් සංවර්ධන)

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන නිලධාරී මණ්ඩලය



ආර්.ඩී. සුසන්ත ප්‍රනාන්දු මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(ප්‍රසම්පාදන හා අලෙවිකරණ)



ඩබ්.පී. උදානි පෙරේරා මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(ඉඩම් හා වත්කම් කළමනාකරණ)
(2021.07.12 දක්වා)



අනුෂා රාජපක්ෂ මෙය
සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)



කේ.ජී. අනුරාධා කාංචනි මිය
සහකාර අධ්‍යක්ෂ
(පර්යේෂණ හා සංවර්ධන)
(2021.07.12 දක්වා)



එම්. පුෂ්පා මිය
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



ආර්.ඒ. සුසන්ත මහතා
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



කේ.අයි. දර්ශනී මිය
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



ඒ.එල්. හර්ෂ දිලංකර මහතා
වැඩ බ සහකාර අධ්‍යක්ෂ
(ඉඩම් හා වත්කම් කළමනාකරණ)
(2021.12.29 සිට)



ජයාත්‍රී ආරියතිලක මිය
වැඩ සහකාර අධ්‍යක්ෂ
(පර්යේෂණ හා සංවර්ධන)
(2021.12.30 සිට)


නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
2021 සංවිධාන ව්‍යුහය
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
උපදේශක කමිටුව
අධ්‍යක්ෂ ජනරාල්
අභ්‍යන්තර විගණක අංශය
මුදල් අංශය
මානව සම්පත් හා පරිපාලන අංශය
සමාජ සමීකරණ අංශය
ප්‍රසම්පාදන හා අලෙවි අංශය
ණය අයකිරීම් / ප්‍රවාහන හා නඩත්තු අංශය
ඉංජිනේරු/ මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ අංශය
නීති අංශය
ඉඩම් අංශය
සැලසුම් හා අධීක්ෂණ අංශය
අධ්‍යක්ෂ (මුදල්)
අධ්‍යක්ෂ (සමාජ සමීකරණ)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන (මා.සම්.සං)
සහකාර අධ්‍යක්ෂ (ස.ස) - 03
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ණය අයකිරීම් / ප්‍රවාහන හා නඩත්තු)
සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)
සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)
සහකාර අධ්‍යක්ෂ (ඉඩම්)
සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
පරිපාලන නිලධාරි
තාක්ෂණ නිලධාරි (1), ඉංජිනේරු සහකාර (1) ප්‍රමාණ සමීක්ෂක (1 කොන්ත්‍රාත්)
සංවර්ධන නිලධාරි (7)
සංවර්ධන නිලධාරි (1) සැලසුම් සහකාර (1)
පද්ධති විශ්ලේෂක(1)
සැලසුම් සහකාර (4)
නීති සහකාර
ප්‍රජා සංවර්ධන සහකාර (1)
ප්‍රජා සංවර්ධන සහකාර (1)
ප්‍රජා සංවර්ධන සහකාර (2)
ප්‍රජා සංවර්ධන සහකාර (1)
ප්‍රජා සංවර්ධන සහකාර (1)
ප්‍රජා සංවර්ධන සහකාර (1)
තාක්ෂණික සහකාර (1)
තාක්ෂණික සහකාර (1)
තාක්ෂණික සහකාර (2)
ක්‍රම ලේඛක (1)
තාක්ෂණික සහකාර (10)
කළමනාකරණ සහකාර (2)
කළමු: සහකාර (6) ස.සං.සහකාර (3)
කළමු: සහකාර (2) ස. සං. සහකාර (2)
කළමු: සහකාර (01) ස. සං. සහකාර (10)
කළමු: සහකාර (2) ස. සං. සහකාර (3)
කළමු: සහකාර (1) ස. සං. සහකාර (4)
කළමු: සහකාර (2)
කළමු: සහකාර (2)
කළ: සහකාර (1)
කළමු: සහකාර (3)
රියදුරු (10)
කාර්යාල කාර්ය සහයක (1)
කාර්යාල කාර්ය සහයක (2) ලේඛන භාරකරු (1)
කාර්යාල කාර්ය සහයක (1)
ගබඩා භාරකාර සහයක (1)
කාර්යාල කාර්ය සහයක (1)
කාර්යාල කාර්ය සහයක (1)
කාර්යාල කාර්ය සහයක (1)

භෞතික සංවර්ධන වැඩසටහන



නිවාස ව්‍යාපෘති පෙලගැස්ම හා ප්‍රගතිය

අතිගරු ජනාධිපතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සෑම පවුලකටම සුවපහසු නිවසක් සඳහා ප්‍රවේශය ලබාදීමේ අරමුණ පෙරදැරිව, අඩු ආදායම්ලාභී හා පහළ මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නාගරික ප්‍රදේශ ආශ්‍රිතව දීර්ඝකාලීන පහසු ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීමට හැකිවන පරිදි දිවයින පුරා විශේෂ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිතය. ඒ අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර ඇති හා 2021 වසර සඳහා සිදුකරනු ලැබූ නිවාස ව්‍යපෘති පෙලගැස්ම හා ඒවායෙහි අත්කරගෙන ඇති ප්‍රගති සමාලෝචනය පහත දැක්වේ.

ලුනාව "සී වීව් රෙසිඩන්සිස්" නිවාස ව්‍යාපෘතිය

- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව නාගරික බල ප්‍රදේශය තුල අක්කර 01 රූඩ් 03 ක් විශාල ලුනාව තානායම්වත්ත නැමති ඉඩමේ 2012 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරනු ලැබූ නිවාස ඒකක 356 කින් සමන්විත "ෟ් ඵසැඅ සෟිසාැබජසි් " නිවාස ව්‍යාපෘතිය මොරටුව මහ නගර සභාව සමග දීර්ඝ කාලයක් තිස්සේ පැවති ගැටලු වලට විසඳුම් ලබාදෙමින් හා දෙපාර්ශවයටම ජයග්‍රහණයන් අත්කර දෙමින් ලුනාව "ෟ් ඵසැඅ සෟිසාැබජසි් " නිවාස ව්‍යාපෘතිය 2021 වර්ෂයේ අප්‍රේල් මස 09 වන දින නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පත් කරන ලදි.
- මෙම ඉඩම ගාලු පාරට කිලෝමීටර් 01 පමණ දුරින් හා ලුනාව දුම්රිය ස්ථානයට ආසන්නව මීටර් 20ක් පමණ දුරින් පිහිටා තිබීම ද, සියලුම පහසුකම් එනම් බැංකු , රෝහල්, පාසල් හා සේවා ස්ථාන සඳහා පහසුවෙන් අඩු කාලයකින් ලගා වීමට හැකි වීම ව්‍යාපෘතිය සඳහා සුවිශේෂී ප්‍රතිලාභයක් වේ. එමෙන්ම මෙම නිවාස සංකීර්ණයේ එක් ගොඩනැගිල්ලක් සඳහා මුහුදු දර්ශනය වීමත් මෙහි ගැණුම්කරුවන් ආකර්ෂණයට මහගු රුකුලක් විය.
- වර්ග අඩි 410, කාමර 02 නිවාස ඒකක 356 විකුණුම් මිලගණන් මිලියන 4.5 - 5.5 ගොඩනැගිලි 03කින් සමන්විත මෙම නිවාස ව්‍යාපෘතියේ නිවාස පහත ආකාරයෙන් බෙදිගොස් ඇත.
  - A - ගොඩනැඟිල්ල- 176
  - B - ගොඩනැඟිල්ල- 92
  - C - ගොඩනැඟිල්ල- 88







නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක පහළ මධ්‍යම ආදායම්ලාභීන්ට බැහැර කිරීමට තීරණය කිරීම හේතු කොට ගෙන ප්‍රතිලාභීන් වෙත ලබා දීම සඳහා මායිම් තාප්පය, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, පෙර පාසල, කළමනාකරණ සංස්ථා කාර්යාලය, ආරක්ෂක අංශය සඳහා කාර්යාලයක් හා අනෙකුත් කුටි, අභ්‍යන්තර මාර්ග හා වාහන නැවැත්වීමේ පහසුකම් ආදිය ද ඇතුළත්ව මෙහි ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත.

මෙහි ඇති ආදර්ශ නිවාස වර්ගයන් 02 සඳහා ගැනුම්කරුවන්ගේ විශාල ඉල්ලුමක් පැවතුන අතර එම නිවාස ඒකක පහසුවෙන් පුද්ගලයන් සඳහා ලබාදිය හැකි විය. 2021 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු නිමකර ජනතා අයිතියට පත් කරන ලද මෙම නිවාස ව්‍යාපෘතිය මගින් පහළ මධ්‍ය ආදායම්ලාභීන්ට නිවාස අලෙවිකරණය සිදුකරනු ලැබූ අතර අධිකාරියේ සේවකයන් සඳහා ද මෙම නිවාස ව්‍යාපෘතිය මගින් පහසු ගෙවීමේ ක්‍රමයට නිවාස ලබාදීම සිදුකරන ලදි.

මෙම නිවාස ව්‍යාපෘතියේ සියලු නිවාස ඒකක විකුණුම් ක්‍රමවේදය මඟින් බැහැර කිරීම සඳහා 2021.12.31 දින වන විට මූලික ගෙවීම් සිදුකර ඇත.

වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද අඩු ආදායම් නිවාස ව්‍යාපෘති

තුඩුවේගොඩ අඩු වියදම් නාගරික නිවාස ව්‍යාපෘතිය - අදියර I



යෝජිත තුඩුවේගොඩ නාගරික නිවාස ව්‍යාපෘතිය හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 59(1) හික්කඩුව නාගරිකය යන ග්‍රාම නිලධාරී වසමේ කුඩාගොඩවවෙලදෙනිය යන ඉඩමේ පිහිටා ඇත. මෙම ව්‍යාපෘතිය අඩු ආදායම් හා මධ්‍යම ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් සිදු කරනු ලබන විශේෂ ව්‍යාපෘතියක් වන අතර මෙය අදියර 02ක් යටතේ සිදු කරනු ලබයි. එහි අදියර 01 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන වෙන් වී ඇත.

මෙහි අදියර 01 සුනාමියෙන් අවතැන් වූ පවුල් 32ක් සඳහා නිවාස එකක 32කින් යුක්ත අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියක් හා අදියර 02 යටතේ

මධ්‍යම ආදායම්ලාභී ප්‍රජාව සඳහා නිවාස ඒකක 160කින් සමන්විත විශේෂ නිවාස ව්‍යාපෘතියක් ලෙස මුළු නිවාස ඒකක 192කින් යුක්තව ව්‍යාපෘතියක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමට යෝජිත වන අතර අදියර 01 සඳහා ඉදිකිරීම් සඳහා වන පිරිවැය

කොටස් වශයෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් හා අදියර 01 ක්‍රියාත්මක කිරීමෙන් පසු නිදහස් වන ඉඩම රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව

ක්‍රමවේදය **(PPP)** යටතේ අදියර 02 ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘති භූමි ප්‍රමාණය මෙහි අදියර 01 සහ අදියර 02 ලෙස වෙන් වෙන් වශයෙන් ප්‍රවේශයන් සහිතව හා පොදු පහසුකම් හවුලේ භාවිත නොවන පරිදි භෞතික වශයෙන් වෙනස්කම් වලින් යුත් ව්‍යපෘති 02ක් ලෙස සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියහි අදියර 01 ක්‍රියාත්මක කිරීමට ප්‍රථමව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සමාජ-ආර්ථික සමීක්ෂණයක් සිදු කොට අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියක් සිදු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත අතර තවද මෙම ප්‍රදේශයේ පිහිටීම සංචාරක කර්මාන්තයට ඇති ඉල්ලුම යන සාධක ඉලක්ක කර ගනිමින් දෙවන අදියර සඳහා මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා වෙළඳපොල සමීක්ෂණයක් සිදු කරන ලදී. එහිදී මෙම ප්‍රදේශයට මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයක් සඳහා දේශීය හා විදේශීය ගැනුම්කරුවන්ගෙන් ඉහල ඉල්ලුමක් ඇති බව තහවුරු විය.

සංකල්පිත සැලසුමට අනුව ව්‍යපෘති අදියර 01 මහල් 4 (බ+3) කින් යුත් ගොඩනැගිලි 02කින් යුක්තව වර්ග අඩි 550 බැගින් වූ නිවාස ඒකක 32කින් සමන්විත වේ. තවද අභ්‍යන්තර මාර්ග පද්ධතිය, පොදු පහසුකම්, විනෝදාස්වාදය සඳහා අවකාශය, මල අපද්‍රව්‍ය බැහැර කරන කාණු පද්ධතිය සංවර්ධනය කිරීම ද, උද්‍යාන අලංකරණ කටයුතු හා වාහන නවතා තැබීමේ පහසුකම් ආදී අංගනයන්ගෙන් ද සමන්විත වේ. අදියර 01 සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලි. 157.9කි.

මෙහිදී ප්‍රාදේශීය ලේකම් හා ක්ෂේත්‍ර නිළධාරීන්ගේ නිර්දේශ මත, මෙම නිවාස ඉලක්කගත ප්‍රතිලාභී පවුල් 32 හට බැහැර කිරීමට කටයුතු කෙරේ. එහිදී ව්‍යාපෘතියේ නිවාස ඒකක බැහැර කිරීම ඉලක්කගත කණ්ඩායමේ ගෙවීමේ ධාරිතාව අනුව තීරණය වන අතර, එහිදී ඉදිකිරීම් පිරිවැයෙන් කොටසක් උපරිම වසර 30 ක් තුළ පොලී රහිත වාරික පදනමක් මත අය කර ගැනීම සිදුවේ. ඒ අනුව, ගෙවීමේ ධාරිතාව සැලකිල්ලට ගනිමින් රු.1,000,000.00 ක මුදලක් උපරිම වසර 30 ක කාලසීමාවකින් පොලී රහිතව අයකිරීමට යෝජනා කෙරෙන අතර, ප්‍රතිලාභියකු

වෙතින් අයකිරීමට අපේක්ෂිත මාසික වාරිකය රු.2,778.00ක් වේ.

තවද මෙම නිවාස ව්‍යාපෘතියේ කළමනාකරණ සංස්ථා අරමුදල ස්ථාපිත කිරීම සඳහා රු.50,000.00 ක මුදලක් සෑම නිවාස ප්‍රතිලාභියකුගෙන්ම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අයකර ගැනීමට ද අපේක්ෂා කෙරේ.

ප්‍රතිලාභීන් වෙත වසර 30ක් ගත වන තෙක් ස්ථිර ඔප්පු ලබාදීමට නොහැකි බැවින්, එම කාල සීමාව තුළ ගොඩනැගිලිවල නඩත්තු වියදම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් දැරිය යුතුව ඇත. එබැවින්, කොන්දේසි සහිත බලපත්‍ර මත භුක්තිය ප්‍රතිලාභීන් වෙත බැහැර කිරීමෙන් පසුව, සාහාධිපත්‍ය ගොඩනැගිලි නඩත්තුව, කලමනාකරණය හා පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා සාහාධිපත්‍ය කලමනාකරණ සංස්ථාව පිහිටුවී සැලසුම් කෙරේ.

2022 වර්ෂයේ ඒකාබද්ධ අරමුදල් ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය වේ. එමෙන්ම මේ වන විට ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන මූලික කටයුතු සිදුකර ඇත.

නාවලපිටිය "සොයිසාකැලේ" ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය







සංවර්ධනය අරමුණු කරගනිමින් යෝජිත ජනාවාසයේ අභ්‍යන්තර, භෞතික සහ සමාජීය යටිතල පහසුකම් සපයාදීමට ද අපේක්ෂා කෙරේ. මෙම නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත, අඩු පහසුකම් ජනාවාසය පවතින ඉඩම

මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැන සකස් කරන ලද සර්වේ ජනරාල්ගේ 1928.02.09 දිනැති පි.පි.8305 දරණ පිඹුරේ කැබලි අංක 01 ලෙස දක්වා ඇති කොටස වන අතර එය නාවලපිටිය ප්‍රාදේශීය බලමණ්ඩලයට අත්පත් වූ අක්කර 05 රූඩ් 01 පර්චස් 24 කින් යුතු ඉඩමෙන්, අක්කර 01යි

පර්චස් 1.9ක් වන කොටසක් වේ. මෙය මු.පි. වන 7035 හි රජය සතු ඉඩම් කොටසක් ලෙස දක්වා ඇත. මෙම ඉඩමෙහි පදිංචිකරුවන් වෙත නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා එකී ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාදීමට නාවලපිටිය නගර සභාව විසින් එකඟත්වය ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ සංකල්පීය සැලසුමට අනුව වර්ග අඩි 550 බැගින් වූ විදුලි සෝපාන රහිත නිවාස ඒකක 83කින් සමන්විත නිවාස යෝජනා ක්‍රමයක් වශයෙන් ඉදිකිරීමට යෝජිත

අතර එය අභ්‍යන්තර මාර්ග පද්ධතිය, පොදු පහසුකම්, විනෝදාස්වාදය සඳහා අවකාශය, සංවර්ධනය කිරීමට යෝජිත මල අපද්‍රව්‍ය බැහැර කරන කාණු පද්ධතිය, උද්‍යාන අලංකරණ කටයුතු, ළමා උද්‍යානයක් හා වාහන නවතා තැබීමේ පහසුකම් ආදී අංගනයන්ගෙන් සමන්විත වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලි. 408ක් වේ.

මෙහිදි ප්‍රාදේශීය ලේකම් හා ක්ෂේත්‍ර නිළධාරින්ගේ නිර්දේශ මත, මෙම නිවාස ඉලක්කගත ප්‍රතිලාභීන් 83 දෙනා හට බැහැර කිරීමට කටයුතු කෙරේ. එහිදි ව්‍යාපෘතියේ නිවාස ඒකක බැහැර කිරීම ඉලක්කගත කණ්ඩායමේ ගෙවීමේ ධාරිතාව අනුව තීරණය වන

අතර, එහිදී ඉදිකිරීම් පිරිවැයෙන් කොටසක් උපරිම වසර 30 ක් තුළ පොලී රහිත වාරික පදනමක් මත අය කර ගැනීම සිදුවේ.

ඒ අනුව, ගෙවීමේ ධාරිතාව සැලකිල්ලට ගනිමින් රු.1,000,000.00 ක මුදලක් උපරිම වසර 30 ක කාලසීමාවකින් පොලී රහිතව අයකිරීමට යෝජනා කෙරෙන අතර,

ප්‍රතිලාභියකු වෙතින් අයකිරීමට අපේක්ෂිත මාසික වාරිකය රු.2,778.00ක් වේ

තවද මෙම නිවාස ව්‍යාපෘතියේ කළමනාකරණ සංස්ථා අරමුදල ස්ථාපිත කිරීම සඳහා රු.75,000.00 ක මුදලක් සෑම නිවාස ප්‍රතිලාභියකුගෙන්ම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අයකර ගැනීමට ද අපේක්ෂා කෙරේ.

ප්‍රතිලාභීන් වෙත වසර 30ක් ගත වන තෙක් ස්ථිර ඔප්පු ලබාදීමට නොහැකි බැවින්, එම කාල සීමාව තුළ ගොඩනැගිලිවල නඩත්තු වියදම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් දැරිය යුතුව ඇත. එබැවින්, කොන්දේසි සහිත බලපත්‍ර මත භුක්තිය ප්‍රතිලාභීන් වෙත බැහැර කිරීමෙන් පසුව, සාහාධිපත්‍ය ගොඩනැගිලි නඩත්තුව, කලමනාකරණය හා පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා සාහාධිපත්‍ය කලමනාකරණ සංස්ථාව පිහිටුවීමට සැලසුම් කෙරේ.

2022 වර්ෂයේ ඒකාබද්ධ අරමුදල් ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය වේ.

නාගරික අඩු ආදායම්ලාභී සහ මැදි ආදායම්ලාභී ප්‍රජාව සඳහා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය ඉඩම් හඳුනා ගැනීම

නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබාදීමට අවශ්‍ය වන ඉඩම් සංචිතයක් හා නාගරික මධ්‍ය ආදායම්ලාභීන්ට දරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා යෝග්‍ය ඉඩම් හඳුනා ගැනීමට නව කළමනාකාරීත්වයේ මග පෙන්වීම මත පුළුල් වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී. එහිදී නිවාස ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම් තෝරා ගැනීමේදී රජය සතු ඉඩම් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වන ලද අතර ඒ සඳහා තොරතුරු ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දීපව්‍යාප්තව සමීක්ෂණයක් සිදු කරන ලදී.

එමෙන්ම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම (LRC), පළාත් පාලන ආයතන වැනි ඉඩම් හිමිකාරීත්වය දරණ අනෙකුත් ආයතන සමඟ ද සම්බන්ධීකරණය වෙමින් ඉදිරි වසර තුන සඳහා නිවාස ව්‍යාපෘතිවලට අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමට හැකි වීම පෙර වසරවලට සාපේක්ෂව සාර්ථක වූ බව සඳහන් කළ යුතුය.

ඒ අනුව අධිකාරියේ ඉදිරි ව්‍යාපෘති පෙළ ගැස්ම සඳහා හඳුනාගත් ඉඩම් අතුරින් ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කරන ලද අතර ශක්‍යතා අධ්‍යයන මත පදනම්ව පහත සඳහන් ඉඩම් සඳහා නව ව්‍යාපෘති සැලසුම් කරන ලදී.

එමෙන්ම තැපැල් දෙපාර්තමේන්තුව සතු හඳුනාගත් ඉඩම්වල ඒකාබද්ධ ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සම්බන්ධවෙමින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය තුළ බහුකාර්ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හැකිවීම ද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය. එහිදී තැපැල් දෙපාර්තමේන්තුව සතු ඌන උපයෝජිත ඉඩම් සංවර්ධනය සඳහා යොදා ගැනීමට අවස්ථාව සැලසෙන අතර දෙපාර්ශවය සඳහාම ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීමට ද ඉඩ ප්‍රස්තා හිමිවේ.

#	විස්තරය	ප්‍රමාණය හෙක්ටයාර්
1	වත්තල, මිල්ලගහවත්ත	2.4532
2	නිට්ටඹුව "ඔර්චඩ් වත්ත"	3.0862
3	ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ	0.2963
4	කඩුවෙල තැපැල් කාර්යාලය	0.2757

වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘති

වත්තල "වැලිසර හයිට්ස් රෙසිඩන්සීස්" නිවාස ව්‍යාපෘතිය



සියනෑ පුරවරයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇල්පිටිවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි "වැලිසර හයිට්ස් රෙසිඩන්සීස්" නිවාස ව්‍යාපෘතිය මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව සඳහා විශේෂ නිවාස ව්‍යාපෘතියක් වේ. මෙය සාමාජීය වශයෙන් වැඩිපහසුකම් යටතේ පුද්ගල අවශ්‍යතාවයන් අනුව යෝජිත ව්‍යාපෘතියක් වන අතර වැලිසර හා රාගම නගර මධ්‍යගතව පිහිටා ඇත. මෙය රාගම දුම්රිය ස්ථානයට ආසන්නව ඉතා මනරම් දර්ශනීය වටපිටාවකට පිහිටා ඇත.

මෙමගින් නිවාස මිලදි ගන්නා පුද්ගලයින් සඳහා, සුපිරි වෙළඳසැල්, ආපනශාලා, රූපලාවන්‍යාගාර, ක්‍රීඩාංගන හා කාර්යාල ගොඩනැගිලි වලින් සමන්විත නිවාස ව්‍යාපෘතියකින් නිවසක් මිළදී ගැනීමේ අවස්ථාව හිමි වේ. පොදු අවකාශ, ළමා උද්‍යාන හා වාහන නවතා තැබීමේ පහසුකම් වලින් ද සමන්විත මෙම නිවාස ව්‍යාපෘති කොළඹ නගරයට කිලෝමීටර්

18ක් හා කොළඹ මීගමුව පාරට ඉතා ආසන්නව පිහිටා ඇත.

සියනෑ පුරවරයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇල්පිටිවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි "වැලිසර හයිට්ස් රෙසිඩන්සීස්" නිවාස ව්‍යාපෘතිය මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව සඳහා විශේෂ නිවාස ව්‍යාපෘතියක් වේ. මෙය සාමාජීය වශයෙන් වැඩි පහසුකම් යටතේ පුද්ගල අවශ්‍යතාවයන් අනුව යෝජිත ව්‍යාපෘතියක් වන අතර වැලිසර හා රාගම නගර මධ්‍යගතව පිහිටා ඇත. මෙය රාගම දුම්රිය ස්ථානයට ආසන්නව ඉතා මනරම් දර්ශනීය වටපිටාවකට පිහිටා ඇත.

මෙමගින් නිවාස මිලදි ගන්නා පුද්ගලයින් සඳහා, සුපිරි වෙළඳසැල්, ආපනශාලා, රූපලාවන්‍යාගාර, ක්‍රීඩාංගන හා කාර්යාල ගොඩනැගිලි වලින්

සමන්විත නිවාස ව්‍යාපෘතියකින් නිවසක් මිළදී ගැනීමේ අවස්ථාව හිමි වේ. පොදු අවකාශ, ළමා උද්‍යාන හා වාහන නවතා තැබීමේ පහසුකම් වලින් ද සමන්විත

මෙම නිවාස ව්‍යාපෘති කොළඹ නගරයට කිලෝමීටර් 18ක් හා කොළඹ මීගමුව පාරට ඉතා ආසන්නව පිහිටා ඇත.

මහල් 06කින් (G + 5) යුක්ත ගොඩනැගිලි 17කින් යුතු නිවාස ඒකක 408කින් සහ සියලු පොදු පහසුකම් වලින් යුක්තව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාක්මක කිරීමට යෝජිතය. මෙහි ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මි. 4.738.68ක් වේ. මෙහි A හා ඊ යන නිවාස වර්ග 02කින් සමන්විත වන අතර A වර්ග සඳහා වූ නිවාස, වර්ග අඩි 700ක් බැගින් වූ නිදන කාමර 02ක්, සාලය, මුළුතැන්ගෙය,නානකාමරය හා බැල්කනියකින් සමන්විත නිවාස 204කින් යුක්තව හා ඊ වර්ග සඳහා වූ නිවාස, වර්ග අඩි 908ක් බැගින් වූ නිදන කාමර 03ක්, සාලය, මුළුතැන්ගෙය, නානකාමරය 02 හා බැල්කනියකින් යුතු නිවාස ඒකක 204කින් සමන්විත වේ.

ඒ අනුව මිල්ලගහවත්ත, වත්තල පිහිටි එක් නිවසක් වර්ග අඩි 700 හා වර්ග අඩි 908 බැගින් වපසරියකින් යුතු නිවාස ඒකක 408ක් සැලසුම්කරණය, ඉදිකිරීම හා ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා සාරානුකූල ප්‍රතිචාර දක්වන ඇගයීම් කරන ලද අවම ලංසුකරුවා ලෙස ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝටියම් (ප්‍රයිවට්) ලිමිටඩ් (**Ms International Construction** සඳබ්දරඑසමප (ඡඩඑ) බඵා ආයතනය තෝරාගන්නා ලදී.

මනරම් සියනෑපුරයේ ඉතා දර්ශනීය වූ භූමි භාගයක පිහිටා ඇති මෙම "වැලිසර හයිට්ස් රෙසිඩන්සීස්" නිවාස ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු ගරු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.12.03 දින මුල් ගල තබා උත්සවශ්‍රීයෙන් මෙහි වැඩ කටයුතු ආරම්භ කරන ලදි.











ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නාගරික නිවාස ව්‍යාපෘතිය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ බටහිර ඇතුල්කෝට්ටේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර තැපැල් කාර්යාලය පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2963ක් විශාල භූමියේ මෙම නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මේ වන විට සැලසුම් කර ඇත. එහිදි වර්ග මීටර් 1950 ප්‍රමාණයකින් යුත් නේවාසික ඉඩ ප්‍රමාණයක් හා වර්ග මීටර් 4,225 ප්‍රමාණයකින් යුත් කාර්යාල පරිශ්‍රයක්, වර්ග මීටර් 225ක ප්‍රමාණයකින් වාණිජ ඒකක සහිත පරිශ්‍රයක් හා වර්ග මීටර් 556කින් යුතු පොදු පහසුකම් සහිත පරිශ්‍රයක් ද ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ඉඩමේ වටිනාකම හා පිහිටීම මුල් කරගනිමින් නේවාසික , වාණිජ හා යෝජිත යන අංශ තුනම කේන්ද්‍ර කරගනිමින් මධ්‍යම ආදායම්ලාභී ප්‍රජාව ඉලක්කක කර ගනිමින් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතින් ලෙස මෙය ක්‍රියාත්මක කිරීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මේ වන විට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ යෝජිත සංකල්පික සැලසුමට අනුව මහල් 11 (G¬10) කින් සහ පහල මහල් 03 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මහල් 03ක කාර්යාල පරිශ්‍රයක් පවත්වාගෙන, යාමට ද ඉතිරි මහල් 07හි වර්ග අඩි 750කින්

සමන්විත නිදන කාමර 02ක් සහිත නිවාස ඒකක 56ක් හා වර්ග අඩි 1000කින් සමන්විත නිදන කාමර 03කින් යුක්ත නිවාස ඒකක 56 ක් සහිත නිවාස ඒකක 112 ක් සහ අමතර ඉහලම මහලයේ නිවාස ඒකක 08ක් (එකතුව නිවාස 120) ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර , මෙහි බිම් මට්ටමේ සිට පහල මහල් 03 රථ වාහන නැවැත්වීම සඳහා යොදා ගැනීමටද අපේක්ෂිත ය. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුළුපිරිවැය රු.මි. 4000ක් වේ.

මෙම ඉඩම නව සංවර්ධන කටයුත්තක් සඳහා ලබාදීම වෙනුවෙන් ඉඩමේ වර්තමාන වටිනාකමට සරිලන පරිදි නව තැපැල් කාර්යාල පරිශ්‍රයක් , අන්තර් තැපැල් හුවමාරු පරිශ්‍රයක් , ජ්‍යෙෂ්ඨ තැපැල් නිලධාරී කාර්යාල පරිශ්‍රය හා නිල නිවාස යන පහසුකම් තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය දැනට මාඝික කුලී ගෙවීමේ පදනම මත පවත්වාගෙන යන බැවින් ඒ සඳහා නව කාර්යාල පරිශ්‍රයක් ස්ථාපිත කිරීමට ද අපේක්ෂිත වේ.

යෝජිත ව්‍යාපෘති භූමි ප්‍රදේශය මිශ්‍ර සංවර්ධනය එනම් වාණිජ හා නේවාසික සංවර්ධනයට සුදුසු

ප්‍රදේශයක පිහිටා තිබීමත් සහ පදිංචිකරුවන් හට තමාගේ අවශ්‍යතා සපුරාගත හැකි පාසල් , බැංකු වාණිජ නගර ,වෙළඳ සංකීර්ණ, බැද්දගාන , දියත උයන වැනි විවෘත අවකාශයන් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි හා යටිතල පහසුකම් වලින් දැනටමත් පරිපූර්ණ ප්‍රදේශයක පිහිටා තිබීම ආයෝජකයන් හා ගැනුම්කරුවන් පහසුවෙන් ආකර්ෂණය කර ගත හැකි වීම ව්‍යාපෘතියේ මහගු ප්‍රතිලාභයක් ලෙස දැක්විය හැකිය.

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා මෙම නිවාස ව්‍යාපෘතිය මගින් නිවාස ලබාදීම සිදුකිරීමට නියමිත අතර පවතින යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම , පහසුකම් සමග ප්‍රදේශයන් නව සංවර්ධනයන් සිදුකිරීමට දායක වීම. කාර්යාල සංකීර්ණය

සඳහා ප්‍රසන්න හා නවතාවයකින් යුක්ත වට පිටාවක් ලබාදීම හා මිශ්‍ර සංවර්ධනය තුලින් ආදායම් උත්පාදනය හා එමගින් භාණ්ඩාගාරයට වැය බරක් නොවී අඩු කිරීම දැනට ඌන පරිභෝජනයට ගෙන ඇති නාගරික ප්‍රමුඛ ඉඩම් වල උපයෝගිතාවය වැඩි කිරීමත් ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර මෙම ප්‍රදේශයේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය මැන බැලීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් එම ව්‍යාපෘතියට අදාල ශක්‍යතා අධ්‍යනයන් ද සිදුකරන ලදි.

මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී සපුරා ගැනීමටත්, සම්පූර්ණ ඉදිකිරීම් සඳහා වන පිරිවැය, ඉතිරි නිවාස ඒකක විකිණීමෙන් ලැබෙන ආදායමෙන් පියවා ගැනීමටත්, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය (PPP) හරහා ක්‍රියාත්මක කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එමෙන්ම ව්‍යාපෘති කමිටුව පිහිටුවා ඇති අතර සංකල්පීය සැලසුම් සකස් කර ඇත. මේ සඳහා ශක්‍යතා අධ්‍යනයක් ද සිදුකර ඇත.







කඩුවෙල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

මිශ්‍ර ව්‍යාපෘතියක් (නිවාස සහ කාර්යාල පහසුකම් සහිත) ක්‍රියාත්මක කිරීම සඳහා කඩුවෙල තැපැල් කාර්යාලය පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මැන සහතික කරන ලද අංක කඩ/ණෘඋ/2021/463 දරණ අනු රේඛනයේ කැබලි අක්ෂර ‘ඊ’ දරණ මු.පි. 1448 හි කැබලි අංක 01 දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.2757 ක් (පර්චස් 108) වූ ඉඩම හඳුනාගෙන ඇත. එම ඉඩම මෙම ව්‍යාපෘතිය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදීමට තැපැල් දෙපාර්තමේන්තුව එකඟතාවය ලබා දී ඇත.

ඉතා ඉහළ වාණිජ වටිනාකමකින් යුත් මෙම ඉඩමේ නිවාස ඇතුලුව වාණිජ, සේවා හා නවතම කාර්යාල පරිශ්‍රයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. එහිදී වර්ග මීටර් 10,818 ක ප්‍රමාණයකින් යුත් නේවාසික ඉඩ ප්‍රමාණයක් හා වර්ග මීටර් 2,711 ක ප්‍රමාණයකින් යුත් කාර්යාල පරිශ්‍රයක් ද ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ඉඩම නව සංවර්ධන කටයුත්තක් සඳහා ලබාදීම වෙනුවෙන් ඉඩමේ වර්තමාන වටිනාකමට සරිලන පරිදි නව තැපැල් කාර්යාල පරිශ්‍රයක්, තැපැල් පුහුණු අභ්‍යාස ආයතනයක් හා නිල නිවාස යන පහසුකම් තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ.



මෙම ව්‍යාපෘතිය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, අවශ්‍ය ප්‍රතිපාදන මහ භාණ්ඩාගාරයට වැය බරක් නොවී සපුරා ගැනීමට රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය **(PPP)** යටතේ ජාතික තරඟකාරී ක්‍රමයට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම මගින් මූල්‍යනය කිරීම අපේක්ෂා කෙරේ.









නිට්ටඹුව "ඕර්චාඩ් වත්ත" නිවාස ව්‍යාපෘතිය



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය , මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ,ගම්පහ සහ ඒ ආශ්‍රිත උප නගර වල පිහිටි රජයට අයත් ඉඩම් හඳුනා ගැනීම සිදු කරන අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම්බඩලුව ග්‍රාමයේ පිහිටි බසෘක/නො/3179 (සැලසුම් අංක 777) කැබලි අංක ලෙස හඳුනාගෙන ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 3.7977 ක් වූ ඉඩම හඳුනාගෙන ඇත. එම ඉඩමෙන් හෙක්ටයාර 3.389 ක භූමි යොදා ගනිමින් නිට්ටඹුව "ඔර්චර්ඩ් වත්ත" නිවාස ව්‍යාපෘතිය සැලසුම් කිරීමට අපේක්ෂා කරන අතර එම ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දීම සඳහා කැමැත්ත පළකර ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහ භාණ්ඩාගාරයට වැය බරක් නොවී සපුරා ගැනීමට රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (PPP) යටතේ ජාතික තරඟකාරී ක්‍රමයට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම මගින් මූල්‍යනය කිරීම අපේක්ෂා කෙරේ.

අනුරාධපුර මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නාගරික ප්‍රදේශ ආශ්‍රිතව දිර්ඝකාලීන පහසු ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීමට හැකිවන පරිදි නිවාස සහ කාර්යාල පහසුකම් සහිතව මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුරාධපුර තැපැල් කාර්යාලය පිහිටි ඉඩම හඳුනාගෙන ඇත.

තැපැල් දෙපාර්තමේන්තුව සතු ඉඩම් වල බහුකාර්ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට හිමිවීමේ ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර තැපැල් කාර්යාලය පිහිටි ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදීමට තැපැල් දෙපාර්තමේන්තුව එකඟතාවය ලබා දී ඇත. මෙහිදී මෙම ඌන උපයෝජිත ඉඩම් සංවර්ධනය සඳහා යොදා ගැනීමට හැකි වන අතර දෙපාර්ශවය සඳහාම ප්‍රතිලාභ ලැබෙන අයුරින් ව්‍යාපෘතිය සැලසුම් කිරීමට කටයුතු සුදානම් කර ඇත.

ඉතා ඉහළ වාණිජ වටිනාකමකින් යුත් මෙම ඉඩමේ නිවාස ඇතුලුව සේවා හා නවතම කාර්යාල පරිශ්‍රයක් ද ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති අතර මෙම ව්‍යාපෘතියේ යෝජිත සංකල්පිත සැලසුමට අනුව පා මහලකින්, බිම් මහලකින් හා ඉහළ මහල් 07කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබේ.

මෙම ව්‍යාපෘතිය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත අතර , අවශ්‍ය ප්‍රතිපාදන මහ භාණ්ඩාගාරයට වැය බරක් නොවී සපුරා ගැනීමට රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (PPP) යටතේ ජාතික තරඟකාරී ක්‍රමයට සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීම මඟින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

අතුරුගිරිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

කඩුවෙල මහ නගර සභාව බල ප්‍රදේශයට හා කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් අතුරුගිරිය ප්‍රදේශයේ පිහිටි සදාසිරිපුර ඉඩමෙහි මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නිවාස

ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර ඇත. මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා දිර්ඝ කාලීන පහසු ගෙවීමේ ක්‍රමයට මෙම නිවාස මිලදී ගැනීමට හැකිවන අයුරින් මෙය ක්‍රියාත්මක කිරීමට යෝජිත වේ.

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ 25 වන වගන්තිය ප්‍රකාරව ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට මෙම ඉඩම පවරා ගැනීමේ හැකියාව පවතියි. ඒ අනුව අතුරුගිරියේ පිහිටි සදාසිරිපුර ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අදිකාරියට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවති

සැලසුම් කරන ලද ණය පහසුකම් ලබාදීමේ වැඩසටහන්

සෞභාග්‍ය දිවිමග

''සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්වෙන ජනතා කේන්ද්‍රිය ආර්ථික පිළිවෙතක් කරා ගමන් කිරීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම සඳහා නාගරික අඩු අදායම්ලාභීන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම ඉලක්ක කර ගනිමින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ''සෞභාග්‍ය දිවිමග" ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි.

එහිදි දීප ව්‍යාප්තව නාගරික බල ප්‍රදේශ වල ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ස්වයං රැකියා නියුක්තිකයන් / ස්වයං රැකියා අපේක්ෂිතයින් ව්‍යවසායකයින් ලෙස බල ගැන්වීම හා එමගින් දළ දේශීය නිෂ්පාදනයට හා ජාතික සංවර්ධනයට දායකත්වයක් ලබාදීම මෙම වැඩසටහනේ මුඛය අරමුණු විය.

මෙම වැඩසටහන සුළු කර්මාන්ත, ව්‍යවසාය සංවර්ධනය, ධීවර කාර්මාන්ත සංවර්ධනය හා නාගරික කෘෂිකර්මාන්ත සංවර්ධන වැඩසටහන යන ප්‍රධාන අංශයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී එක් ප්‍රතිලාභියෙකු වෙත රු.300,000ක උපරිම ණය මුදලක් ලබාදීම හා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතිය සඳහා 20%ක ප්‍රතිලාභ දායකත්වයක් ද ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙනුවට රාජ්‍ය බැංකුවක් මෙය ක්‍රියාත්මක කරන ලෙසට නිර්දේශ ලබා දී ඇත. ඒ අනුව මහජන බැංකු සමඟ සම්බන්ධ වෙමින් ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට ගිවිසුම් අත්සන් කර ඇත. එහි දී ණය අයදුම්කරුවන් හඳුන්වා දීම හා ණය ලබා දීමෙන් පසුව එම ප්‍රතිලාභීන් ලබා ගෙන ඇති ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය හා මෙහෙයවීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් සිදු කරයි.





සැලසුම් කරන ලද ණය පහසුකම් ලබාදීමේ වැඩසටහන්





සතුටු පවුලක් සෞභාග්‍යමත් නිවසක්

දීප ව්‍යාප්තව විසිරි පවතින නාගරික කලාප තුළ පිහිටි අර්ධ නිමි නිවාස / අබලන් වූ නිවාස , නිමි නිවාස බවට පත් කරමින් නාගරික නිවාස සංචිතය සඳහා ප්‍රමිතිගත නිවාස එක් කිරීම අරමුණු කරගත් ''සතුටු පවුලක් - සෞභාග්‍යමත් නිවසක් '' නිවාස ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ. මෙම වැඩසටහන දීප ව්‍යාප්තව පිහිටි දිස්ත්‍රික්ක 25ක ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

මෙහිදි තෝරා ගන්නා ප්‍රතිලාභීන්ට විධිමත් මූල්‍ය ආයතන වෙත ප්‍රවේශ වීමට නොහැකි බැවින් ඒ සඳහා මූල්‍යමය සහය ලබාදීම හා නිවාස වැඩි දියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදෙමින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරා දීම මෙහි මූලික අරමුණු විය.

වැඩසටහනේ නියමු ව්‍යාපෘතියක් ලෙස අර්ධ නිමි නිවාස / අබලන් වූ නිවාස 1,000ක් තෝරා ගනිමින් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.500,000ක ණය මුදලක් ලබාදීමට අපේක්ෂාව විය.

මෙම ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ පිරිවැය ද ඇතුළුව මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය රුපියල් මිලියන 517.63ක් වූ අතර මෙම ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. එහිදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා මහා භාණ්ඩාගාර අරමුදල් වෙන් කිරීමක් වෙනුවට රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවක් හරහා ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

එබැවින් මේ වන විට මෙම වැඩසටහන බැංකුව හරහා ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සාකච්ඡා මට්ටමේ පවතී.

නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ඔප්පු ලබාදීම්

බොරැල්ල "සහස්පුර" මහල් නිවාස ව්‍යාපෘතිය



නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ සහස්පුර මහල් නිවාස සංකීර්ණයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති නිවාස 204න් නිවාස 38ක් නිදහස් දීමනාවක් මත පැවරීම හා 01ක් නිවසක්, අදාළ විකුණුම් වටිනාකම ගෙවීම අවසන් කිරීමෙන් පසුව පැවරීම යන ක්‍රම 02 යටතේ සින්නක්කර ඔප්පුවක් මඟින් නිවාසවල අයිතිය ප්‍රතිලාභීන් වෙත පැවරීම.2021.03.16 වන දින සහස්පුර මහල් නිවාස ව්‍යාපෘතියේ ඔප්පු ලබාදීම සිදු කරන ලදී.



මානව සංවර්ධන වැඩසටහන



"ස්වශක්ති"

මානව සංවර්ධන වැඩසටහන -2021

දීප ව්‍යාප්තව දිස්ත්‍රික්ක16 ක නාගරික ජනාවාස 27ක ජීවත් වන කුටුම්භ 5,593ක සමාජ-ආර්ථික තත්ත්වය නඟා සිටුවීම 2021 වර්ෂය තුළ "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන යටතේ සිදු කරන ලදී. මේ යටතේ කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, මහනුවර, ත්‍රිකුණාමලය, කුරුණෑගල, කෑගල්ල, රත්නපුර, මන්නාරම, නුවර එළිය, හලාවත සහ බදුල්ල යන දිස්ත්‍රික්ක ඇතුළත්ය. බිම් මට්ටමේ ප්‍රජා සහභාගීත්ව මැදිහත්වීම් හරහා ප්‍රජා පාදක විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් කොවිඩ් 19 වසංගතයේ බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා මෙහිදී සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශය අනුව මානව සංවර්ධන වැඩසටහන එහි ප්‍රධාන වැඩසටහන් හතරක් (04) හරහා අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාව ක්‍රියාකාරී ලෙස මැදිහත් කර ගනිමින් හා ඔවුන්ව ඒ සඳහා දිරිමත් කරමින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙම එක් එක් වැඩසටහන උප වැඩසටහන් කිහිපයක් ඇතුළත්ව එහි ප්‍රධාන වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාවට නංවන ලදී. 2021 වර්ෂය සඳහා මානව සංවර්ධන වැඩසටහන වෙනුවෙන් අනුමත භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 30.0 ක් විය.

ඒ අනුව මෙම ප්‍රතිපාදන මඟින් කොවිඩ් වසංගතය ව්‍යාප්තව තිබියදී ද අභියෝග ජය ගනිමින් මානව සංවර්ධන වැඩසටහන පහත සඳහා ප්‍රගතීන් ලබා ගනිමින් සාර්ථකව පවත්වන ලදී.

ඃ	වැඩසටහන	2021 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන	2021 වර්ෂය තුළ මුල්‍ය ප්‍රගතිය	2021 වර්ෂය තුළ භෞතික ඉලක්කය	2021 වර්ෂය තුළ භෞතික ප්‍රගතිය
	මානව සංවර්ධන වැඩසටහන	30.00	21.55	100%	94%
01	සෞභාග්‍යා ප්‍රජා ශක්ති - ප්‍රජාව සාමාජීය වශයෙන් බල ගැන්වීමේ වැඩසටහන	13.24	8.86	100%	97%
02	සෞභාග්‍යා සවිබල - ප්‍රජාව ආර්ථික වශයෙන් බල ගැන්වීම	6.72	4.00	100%	76%
03	සෞභාග්‍යා නැණබල - ළමා හා තරුණ තරුණියන් අධ්‍යාපනික වශයෙන් බල ගැන්වීමේ වැඩසටහන	5.13	4.81	100%	100%
04	සෞභාග්‍යා දිවිවරුණ - ප්‍රජාව සංස්කෘතිකමය වශයෙන් බලගැන්වීමේ වැඩසටහන	2.94	2.51	100%	100%
05	ලෝක ජනාවාස දින වැඩසටහන	1.97	1.37	100%	100%

සෞභාග්‍ය ප්‍රජා ශක්ති -
සාමාජීය වශයෙන් ප්‍රජාව බල ගැන්වීම

සෞභාග්‍ය ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභීන් අතර ප්‍රජා මුල සංවිධාන ඇති කර සංස්කෘතිමය විවධත්වය තේරුම් ගනිමින් ප්‍රජාව තනි තනිව හා සාමුහික ලෙස සාමාජීය වශයෙන් බල ගැන්වීම සිදු කරයි.

ප්‍රජා මූලික සංවිධාන (CBOs) පිහිටුවීම සහ ශක්තිමත් කිරීම මඟින් වැඩසටහන්වල තිරසාර බව සහතික කළ බැවින් මෙය ප්‍රජා සංවර්ධනයේ තීරණාත්මක අංගයකි. 2021 වර්ෂයේදී දී, ප්‍රජා මූලික සංවිධාන 27ක් පිහිටුවන ලද අතර, මෙම සංවිධාන පවත්වාගෙන යාම සඳහා මූලික තාක්ෂණික සහය සහ මූල්‍ය ආධාර සපයන ලදී. කැඩසා 19 වසංගතය මධ්‍යයේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ප්‍රජා මූලික සංවිධානයන් හි තිරසාර ක්‍රියාකාරීත්වයට සහාය වීම සඳහා දිවයින පුරා දිස්ත්‍රික්ක 16 ක ජනාවාස 27 ක් සමඟ කටයුතු කළේය. වසර අවසානයේ ඇගයීමේ නිර්ණායකයන් මත පදනම්ව මෙම ප්‍රජා මුල සංවිධාන ඇගයීමට ලක් කොට ඉන් ප්‍රජා මුල සංවිධාන 03ක් තෝරා ගන්නා ලදී.

අඩු පහසුකම් ජනාවාසයන්හි ජීවත්වන ප්‍රජාව මත්ද්‍රව්‍යවලින් වළක්වාලීම සඳහා දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන් යන ඵලදායි ප්‍රවේශයන් හරහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2021 වර්ෂය තුළ තෝරා ගත් නාගරික අඩු පහසුකම් ජනාවාස 17ක් තුළ "මතින් නිදහස් ජනාවාසයක්" වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ගෝලීයව ව්‍යාප්ත වුණ COVID-19 වසංගතයට ප්‍රතිචාර ලෙස නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අත්‍යවශ්‍ය සහන සේවා අඛණ්ඩව පවත්වාගෙන යමින් ප්‍රජාව සම්බන්ධ කරගෙන ප්‍රාථමික සෞඛ්‍ය සේවා ක්‍රම වඩාත් ප්‍රත්‍යස්ථ කිරීමට සිය සෞඛ්‍ය වැඩසටහන් උපයෝගී කර ගන්නා ලදී. එමෙන්ම ආබාධිත පුද්ගලයින්ට අත්‍යාවශ්‍ය විශේෂ සත්කාර උපකරණ ලබා දීම මඟින් ඔවුන්ට ඔවුන් විසින්ම සමාජයේ ප්‍රමුඛස්ථානයට ප්‍රවේශ වීමට පිටුවහලක් විය. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් තව දුරටත් පසුබැසීමේ අවදානමට ලක්ව කැඩෂෘ-19 වසංගතයේ බලපෑමට ලක් වූ ආබාධිත පුද්ගලයින් පිළිබඳ අවධානය යොමු කරන ලදී.

නාගරික ජනාවාසයන්හි ව්‍යාප්ත වන වෛරස් රෝග, ඩෙංගු රෝගය සහ Covid 19 රෝගය පාලනය සහ වැළැක්වීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය, ජලයෙන් බෝවන රෝග පිළිබඳව, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක වැඩසටහන් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම මෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය වැඩි කිරීමට උපායමාර්ගික සහ ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඉහළ අවදානම් සහිත නාගරික අඩු පහසුකම් ජනාවාසවල ව්‍යාප්ත වූ වසංගත තත්ත්වය සඳහා මහජන සෞඛ්‍ය සහ සමාජ පිළිවෙත් වඩා හොඳින් පුහුණු කිරීමට සහ පිළිපැදීමට මෙම වැඩසටහන් උපයෝගී විය.

සාර්ථකත්වයේ ප්‍රතිඵල 1



2021 ජුනි මාසයේදී ශ්‍රී ලංකාවට බලපෑ විනාශකාරී ගංවතුරෙන් පසුව, කැලණි ගඟ පිටාර ගැලීමෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ගංගාරක්ෂිතය ජනාවාස ප්‍රදේශවාසීන්ට දැඩි බලපෑම් සිදු විය. මෙම ව්‍යසනයට ප්‍රතිචාර වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් විපතට පත් ප්‍රජාවන් සඳහා හදිසි සහනාධාර සැපයීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඉදිරිපත් විය. එහිදී පවුල් 400කට හදිසි සහනාධාර ලැබිණි.

සාර්ථකත්වයේ ප්‍රතිඵල 2

"මතින් නිදහස් ජනාවාසයක්" වැඩසටහන හරහා රත්නපුර, මාදම්පේ යුත් ඊගල් සමාජය විසින් සංවිධානය කරන ලද මත්ද්‍රව්‍ය විරෝධී සහ අනෙකුත් මත්ද්‍රව්‍ය අපචාර වැළැක්වීමේ වැඩසටහන් රැසක් හරහා වෙළෙඳුන් දැනුවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස දුම්වැටි අලෙවි කරන වෙළඳසැල් 47න් 42ක්ම දුම්පානය නතර කර ඇත.



ඉහළ ප්‍රතිඵල

- තෝරාගත් ජනාවාස 27 ක සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණ 27ක් සිදු කර තොරතුරු රැස් කර කරන ලදී.
- ජනාවාස 27ක ස්ථාපිත කරන ලද ප්‍රජා මූල සංවිධාන වල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය සහ උපකරණ ලබා දෙන ලදී.
- මත්ද්‍රව්‍ය, මධ්‍යසාර සහ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව දැනුවත් කිරීම සහ වැළැක්වීම පිළිබඳව පුද්ගලයින් 770 දෙනෙකු සඳහා වැඩසටහන් 15ක් පවත්වන ලදී.
- ක්ෂය රෝගයට ගොදුරු වූ පුද්ගලයින් 175 දෙනෙකු සඳහා අත්‍යාවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය සමඟ ක්ෂය රෝග ඖෂධ භාවිතය දිරිමත් කිරීම සඳහා වැඩසටහන් 02 ක් පැවැත්වීය.
- ශ්‍රී ලංකාවේ පිහිටි යුනිසෙෆ් (**UNICEF**) ආයතනය හා එක්ව කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල නිවාස 3,290 ක් සඳහා කඩඵෂ 19 වැළැක්වීම සහ පාලනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 03 ක් පැවැත්වීය.
- නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල කැඩසා 19 වෛරසය වැලැක්වීමට සහ පාලනය කිරීමට රජය ගන්නා උත්සාහයන්ට සහාය වීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාතේ තෝරාගත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (**MOH**) කාර්යාල 21කට අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා සපයන ලදී.
- අබාධිත පුද්ගලයින් 47 දෙනෙකුට ඔවුන්ගේ ආත්ම විශ්වාසයට අත්‍යවශ්‍ය සෞඛ්‍ය උපකරණ ලබා දීම සඳහා වැඩසටහන් 10 ක් පවත්වන ලදී.







- ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා ශ්‍රවණාධාර 08ක් ලබා දෙන ලදී.
- මාතෘ රුකවරණය වැඩිදියුණු කිරීම සහ අලුත උපන් බිළිදාට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධයෙන් ගැබිණි මව්වරුන් 106 දෙනෙකු සඳහා වැඩසටහන් 17ක් පැවැත්වීය.
- ඩෙංගු නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් පවත්වන ලදී.
- ගංවතුරෙන් විපතට පත් පවුල් 400කට හදිසි සහනාධාර ලබා දෙන ලදී.







SP 1.1: ජනාවාස 27 හි අවශ්‍යතා හඳුනා ගැනීම

SP 1.1 (SP 1.2: ප්‍රජා මූල සංවිධානයන්හි තිරසාර ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රජා පාදක සංවිධානය ශක්තිමත් කිරීම27 හි අවශ්‍යතා හඳුනා ගැනීම





SP 1.3: මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පුනරුත්ථාපනය කිරීම



SP 1.4: ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන





සෞභාග්‍ය සවිබල

ප්‍රජාව ආර්ථික වශයෙන් බල ගැන්වීමේ වැඩසටහන

ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ප්‍රජාවගේ ආර්ථික යහපැවැත්ම නංවාලීමේ අරමුණින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, 2012 සිට 2019 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ තෝරාගත් ප්‍රදේශයන්හි වැඩසටහන් 379 ක් පැවැත්වීමට සම්බන්ධ විය.

නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර පුළුල් කිරීමට අවශ්‍ය ව්‍යවසායකයින් සඳහා කුඩා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට සහනදායී අඩු පොළී අනුපාත මත ස්වශක්ති ණය ලබා දෙන ලදී. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු පහසුකම් ජනාවාසවල කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා පුහුණු වැඩසටහන් හරහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දුන්නේය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මැදිහත්කරුවෙකු ලෙස සම්බන්ධ වෙමින් ව්‍යවසායකයෙකු ගොඩනැගීමට සහ ඔවුන්ට ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වෙළඳපල අවස්ථා සංවර්ධනය කිරීමට 2021 වර්ෂයේදී ආහාර හා වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

සාර්ථකත්වයේ ප්‍රතිඵල 3:



ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල ප්‍රජාවන්ගේ ආර්ථික යහපැවැත්ම නංවාලීමේ කොටසක් ලෙස, තිරසාර ආදායමක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ ඔවුන්ගේ දැනුම ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා නව සහ පවතින ක්ෂුද්‍ර/කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

ත්‍රිකුණාමලය, ගම්පහ, කොළඹ, ගාල්ල, කුරුණෑගල, මාතර, නුවරඑළිය, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි සිටින ව්‍යවසායකයින් 628 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන හරහා ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීමට 14ක් පවත්වන ලදී.



සාර්ථකත්වයේ ප්‍රතිඵල 4:



COVID-19 වෛරසය පැතිරීම සමාජ-ආර්ථිකමය වශයෙන් අඩු මට්ටමක පවතින, විශේෂයෙන්ම අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන ප්‍රජාවට බලපාන ලදී. පවතින වෛරස ව්‍යාප්තිය හේතුවෙන් ස්වයං රැකියාලාභීන්ට තම නිෂ්පාදන අලෙවි කර ගැනීමට මාර්ගයක් නොමැතිව විවිධ බාධකවලට මුහුණ දීමට සිදුව තිබේ.





මෙහිදී මානව සංවර්ධන වැඩසටහනේ 2.2 උප වැඩසටහන යටතේ රාගම ප්‍රදේශයේ පදිංචි දයා මල්ලිකා මහත්මියට ඇයගේ නිෂ්පාදන වන නැවුම් පළතුරු යුෂ සහ බත් පැකට් මහබාගේ හන්දියේ අලෙවිය කිරීමට ජංගම කරත්තයක් ලබා දෙන ලදී. මෙමගින් ප්‍රතිලාභියාට නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නිශ්චිත ස්ථානයක් හිමි කර ගැනීමටත්, වඩා හොඳ පාරිභෝගික නිරාවරණයක් කරා ළඟා වීම සඳහා තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමටත්, ඔවුන්ගේ වෙළඳපල අවකාශය පුළුල් කිරීමටත් හැකි විය

ඉහළ ප්‍රතිඵල

- නව නිෂ්පාදන, සේවා, වෙළඳපල, නව තාක්ෂණයන් සඳහා මෙන්ම නිෂ්පාදන ක්‍රම අනුගමනය කිරීමට සඳහා පුහුණුවීම් සහ දැනුවත් කිරීමේ මාර්ග සමගින් අලුත් සහ දැනට සිටින ව්‍යවසායකයින් 628ක් බිහි කරන ලදී.
- ව්‍යවසායකත්වය හරහා නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ප්‍රජාව තුළ ක්ෂුද්‍ර/කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු සංඛ්‍යාව 14 ක් පැවැත්වීය.
- ව්‍යවසායකයින් 254 දෙනෙකු සඳහා වෙළඳපල අවස්ථා නිර්මාණය කර දී ඇත.
- ව්‍යවසායකයින් 16 දෙනෙකුට ස්වශක්ති ණය යෝජනා ක්‍රමය ලබා දී ඇත
- ව්‍යවසායකයින් 20 දෙනෙකුට තම නිෂ්පාදන අලෙවි කිරීමට ජංගම කරත්ත ලබාදී ඇත



SS 2.2: : නව සහ දැනට සිටින කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය ආධාර සහ උපකරණ ලබා දීම





SS 2.1: කුඩා පරිමාණ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම



SS 2.3: කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳපල හඳුන්වා දීම





සෞභාග්‍ය නැණබල –
අධ්‍යාපනික අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2015, 2016 සහ 2017 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් පැවත්වීමට සම්බන්ධ වී ඇති අතර, කොළඹ දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 18 ත් 30 ත් අතර පුද්ගලයින් 332 දෙනෙකුට එලෙස සහාය ලබා දී ඇත.

නාගරික ජනාවාසවල ජීවත්වන ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලියට සහභාගී වීමට අවශ්‍ය මඟපෙන්වීම හා දිරිගැන්වීම් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දීම මඟින් 2021 වර්ෂයේදී තෝරාගත් ප්‍රදේශවල යෞවන සමාජ සහ ළමා සමාජ පිහිටුවීමට අප අධිකාරිය සහාය ලබා දී ඇත. ලියාපදිංචි යෞවන සමාජ සහ ළමා සමාජ සංඛ්‍යාව පසුගිය වසරවල වැඩි වී ඇති අතර තෝරාගත් ඉලක්කගත ප්‍රදේශවල වඩාත් අවදානමට ලක්විය හැකි ළමුන් සහ තරුණයින් දිරිමත් කරමින් එහි අදාළ ප්‍රජා මූලික සංවිධාන සමඟ හවුල් වී යෞවන සහ ළමා සමාජ පිහිටුවීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඔවුන්ට ශක්තියක් වී ඇත.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂයේදී පාසල් උපකරණ ලබා ගැනීමට නොහැකි වූ ළමුන් 571 දෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය ලිපි ද්‍රව්‍ය සහ පාසල් ද්‍රව්‍ය ලබා දීමෙන් සහය වී ඇත. 2021 වසර වන විට 'ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන යටතේ ලියාපදිංචි කර ඇති මුළු ළමා සමාජ ගණන 29 කි.

COVID-19 වසංගතය ව්‍යප්තියේදී ලොව පුරා පාසල් වසා දැමූ කාලය තුළ, දරුවන් ගෝලීය ඉගෙනුම් අර්බුදයකට මුහුණ දුන්හ. 2021 වර්ෂය තුළ දී, Covid 19 වසංගතය හේතුවෙන් රට වසා දැමූ කාලය තුළ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මාර්ගගත (ඩිසරඑම්ක) උපකාරක පන්ති හරහා ඉගෙනීමේ කටයුතු නොකඩවා කරගෙන යාම සහතික කිරීමට නව්‍ය ක්‍රම සොයා ගන්නා ලදී. අඩු වරප්‍රසාදලාභී පාසල්වල තොරතුරු තාක්ෂණ දැනුම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික්ක 4 ක හඳුනාගත් පාසල් 6 කට තොරතුරු තාක්ෂණ උපකරණ සහ සම්පත් මධ්‍යස්ථාන ලබා දෙන ලදී. වෘත්තීය මාර්ගෝපදේශනය, වෘත්තීය පුහුණුව සහ නායකත්වය පිළිබඳ කුසලතා සංවර්ධන වැඩසටහන්, HIV/AIDS ඇතුළුව ප්‍රජා වගකීම සහ සමාජ සහජීවනය, ප්‍රජනක සෞඛ්‍යය සහ මත්ද්‍රව්‍ය සහ මධ්‍යසාර දැනුවත් කිරීම යනාදිය ආවරණය කෙරෙන ක්‍රියාකාරකම්හි දී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් වෘත්තීය අපේක්ෂාවන් ගොඩනැගීම සඳහා තරුණ කුසලතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අවස්ථා 583ක් ලබා දී ඇත.

සාර්ථකත්වයේ ප්‍රතිඵල 5:



කැලණිය ගඟ රක්ෂිත ජනාවාසයේ ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන මගින් ප්‍රථම වරට "කැලණි කැකුළු" ළමා සමාජය නමින් ළමා සමාජයක් ස්ථාපිත කරන ලදී. දැනට ළමා සමාජයේ ළමයි 35ක් සිටී.

2021 වසරේ පැවති ප්‍රජා නායක සම්මාන ප්‍රදානෝත්සවයේදී ළමා සමාජයේ ගැහැණු ළමුන් දස දෙනෙකු විසින් "උඩ වැඩියා මලේ"ගීතයට නිර්මාණාත්මක නර්තනයක් ඉදිරිපත් කරන ලදී. මෙම දරුවන්ට පොදු වේදිකාවක රඟ දැක්වීමට අවස්ථාව ලැබුණු පළමු අවස්ථාව මෙයයි; 2021 වසරේ පැවති ලෝක ජනාවාස දින සම්මාන උළෙලේ වේදිකාවේ රඟ දැක්වීමට ද ඔවුන්ට අවස්ථාව ලැබුණි. අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි කුඩා දරුවන්ට ඔවුන්ගේ සෞන්දර්ය කුසලතා ප්‍රදර්ශනය කිරීමට හැකිවීම ඔවුන් ලැබූ විශාල ජයග්‍රහණයකි.

ඉහළ ප්‍රතිඵල

- නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන ආදායම්ලාභී පවුල්වල පාසල් හැරගිය දරුවන් 06 දෙනෙකුගේ අධ්‍යාපන කටයුතු නොකඩවා සිදු කර ගෙන යාමට සහාය විය.
- දිස්ත්‍රික්ක 4 ක නාගරික, අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි, පාසල් සඳහා සම්පත් මධ්‍යස්ථාන 06 ක් පිහිටුවන ලදී.
- නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණුව පිළිබඳව පවත්වන ලද අතථ්‍ය (ඩසරඑම්ක) සහ පුද්ගල වැඩමුළු 26ක් පැවැත්විය.
- පෙර පාසල් 05කට ප්‍රතිලාභ සැලසෙන පරිදි පෙර පාසල් උපකරණ 243ක් ලබා දී ඇත
- ජනාවාස 4 ක පුස්තකාල 04 ක් ස්ථාපිත කරන ලදී.
- මූලික අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා ළමුන් 571 දෙනෙකුට අත්‍යාවශ්‍ය පාසල් ද්‍රව්‍ය / ලිපි ද්‍රව්‍ය ලබා දී ඇත.
- කෑඩසා 19 වසංගත කාලය තුළ එදිනෙදා පාසල් විෂයයට උපකාර කිරීම සඳහා මාර්ගගත (ඩසරඑම්ක) වැඩමුළු 10 ක් පැවැත්විය.
- ස්ථාපිත/ශක්තිමත් කරන ලද ළමා සමාජ සංඛ්‍යාව 14 ක් මගින් එම ප්‍රජාවගේ සංවර්ධනය තුළ අන්‍යෝන්‍ය ලෙස බලපැවැත්වීමට සමඟ අන්තර් ක්‍රියා කිරීමට, නව්‍යකරණයට සහ සහභාගී වීමට අවස්ථාව සලසා දී ඇත.
- තරුණ පුද්ගලයින් 1223 දෙනෙකුට වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධන සහාය සඳහා ප්‍රවේශය ලබා දී ඇත.







SN 3.1: තරුණ හා ළමා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම



SN 3.2: අඩු වරප්‍රසාද සහිත පාසල් සඳහා ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම







SN 3.3: නිපුණතා සංවර්ධනය සහ වෘත්තීය පුහුණුව පිළිබඳ වැඩමුළු පැවැත්වීම

සෞභාග්‍ය දිවිවරුණ -
ආගමික හා සංස්කෘතික සවිබල ගැන්වීමේ වැඩසටහන

2021 වර්ෂයේ දී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් විවිධ ප්‍රජාවන් අතර සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා පවුල් 1,380 කට බහු සංස්කෘතික සහ බහු ආගමික ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට පහසුකම් සලසමින් නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාවන් අතර බහු-ආගමික සහ බහු සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2021 වර්ෂයේදී තෝරාගත් ජනාවාසවලින් හඳුනාගත් ළමුන් 446 දෙනෙකු අත්‍යාවශ්‍ය උපකරණ සමඟ දහම්පාසල් අධ්‍යාපනය සඳහා යොමු කර ඔවුන් දිරිමත් කරන ලදී. කෑඩසා 19 වසංගත කාලය තුළ නාගරික ජනාවාසවල ජීවත් වන සෞන්දර්යාත්මක කුසලතා ඇති ළමුන් 628 දෙනෙකු ඒ සඳහා දිරිමත් කරන ලදී.

නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභී ජනාවාසවල ජීවත් වන පුද්ගලයන්ට වසංගත කාලසීමාව තුළ අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම කෙරෙහි Covid 19 ප්‍රධාන වශයෙන් බලපාන ලදී. විශේෂයෙන්ම, අනාගත මව්වරුන් සෘජුවම බලපෑමට ලක් විය. හුදකලාව, ආතතිය සහ කාංසාව අවම කිරීමේ අරමුණින් ගැබිණි මව්වරුන් සහ අනෙකුත් ප්‍රජා සාමාජිකයින් 560 දෙනෙකුට වැඩමුළු 12ක් හරහා උපදේශනය සහ මනෝ සමාජීය සහය පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම් ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ආයතනයේ සහයෝගයෙන් කාර්ය මණ්ඩලය 30 දෙනෙකු සඳහා කාර්ය මණ්ඩල පුහුණුවක් පවත්වන ලදී.

සාර්ථකත්වයේ ප්‍රතිඵල 6:

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් කැඩසා-19 වසංගතය හමුවේ ගර්භනී මව්වරුන්ට මනෝ සමාජීය සෞඛ්‍ය සේවා පහසුකම් සහිත වැඩසටහන්වලට සහාය වීම මඟින් මාතෘ සහ අලුත උපන් බිළිඳු රැකවරණය ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබීය. සෞභාග්‍ය දිවිවරුණ වැඩසටහන යටතේ 'ධඩඵ තාක්ෂණය හරහා දිස්ත්‍රික්ක 16 ක් තුළ ජනාවාස 27 ක නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල වෙසෙන ගැබිනි මවුවරුන්ගේ යහපැවැත්ම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීය.

"මෙය රට වසා තිබූ කාලය තුළ සිදු කළ ඉතා හොඳ වැඩසටහනක්",
ඩී. එම්. එස්. තරංගනී ටී. මැදවච්චිය

"අපි මේ වැඩසටහන මඟින් ගොඩක් දේවල් ඉගෙන ගත්තා",
රළජයපුර, රත්ගම, ගාල්ල

ඉහළ ප්‍රතිඵල

- ප්‍රජාවන් අතර ජනවාර්ගික සාමුහිකත්වය පෝෂණය කිරීම සඳහා පවුල් 752 ක් සහභාගී කර ගෙන බහු ආගමික වැඩසටහන් පවත්වන ලදී.
- අත්‍යාවශ්‍ය උපකරණ සහිතව දහම් පාසල් අධ්‍යාපනය සඳහා ළමුන් 446 ක් යොමු කර දිරිමත් කරන ලදී.
- විවිධ ප්‍රජාවන් අතර සමාජ සහජීවනය වැඩි දියුණු කිරීම සඳහා පවත්වනු ලබන සැසි සහිත බහු-ආගමික වැඩසටහන් 17ක් පවත්වන ලදී.
- නිර්මාණශීලිත්වය සහ සෞන්දර්යාත්මක කුසලතා ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සඳහා පුද්ගලයන් 628 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද බහු සංස්කෘතික වැඩසටහන් 13 ක් පැවැත්වීය.
- නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන අඩු ආදායම්ලාභීන් 560 දෙනෙකුට ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ශ්‍රී ලංකාවේ පිහිටි ආයතනය හා සහයෝගය ඇතිව මනෝ-සමාජ සෞඛ්‍ය ආරක්ෂණ දැනුම සමඟ මානසික සෞඛ්‍ය සහාය ලබා දෙන ලදී.
- ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ශ්‍රී ලංකාවේ පිහිටි ආයතනය සමඟ සහයෝගය ඇතිව උපදේශන සහ මනෝ සමාජීය සහය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 12ක් ක් පැවැත්වීය.





SD 4.1: බහු ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහන









SD 4.2:: මනෝ-සමාජ ආධාරක වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2021 ලෝක ජනාවාස දින සැමරුමට සමගාමී වැඩසටහන්



ලෝක ජනාවාස දිනය වාර්ෂිකව ඔක්තෝබර් පළමු සඳුදා සමරනු ලැබේ. මෙම අවස්ථාව මානව ජනාවාසවල තත්ත්වයන් සහ එහි ජීවත්වන ප්‍රජාවට ප්‍රමාණවත් නවාතැන් පහසුකම් සඳහා සියලු දෙනාට ඇති අයිතිය පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. මෙම වසරේ ලෝක ජනාවාස දිනය 2021 ඔක්තෝබර් 4 වන සඳුදා සමරනු ලැබීය. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය (USDA) විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 25 තුළ නාගරික, අඩු පහසුකම් සහිත ප්‍රජාවන් කේන්ද්‍ර කර ගනිමින් "කාබන්වලින් තොර ලෝකයක් සඳහා නාගරික ක්‍රියාමාර්ග කඩිනම් කිරීම" යන මෙවර ලෝක ජනාවාස වාර්ෂික තේමාව යටතේ ක්‍රියාකාරකම්වල නිරත විය. 2021 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් අංග තුනක් සංවිධානය කර තිබුණි.

1. ළමා චිත්‍ර තරඟය (වයස 6-9, වයස 10-14 සහ වයස 15-18 යන කාණ්ඩ 3)
2. විවෘත ප්‍රහේලිකා තරඟය
3. ක්ෂුද්‍ර/කුඩා/මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳ ප්‍රදර්ශනය







ඉහළ ප්‍රතිඵල

- චිත්‍ර තරගය සඳහා නිර්මාණ 3,000 ක් ලැබුණි.
- කලාත්මක කුසලතා තවදුරටත් දිරිමත් කිරීම සඳහා එක් එක් කාණ්ඩයෙන් ජයග්‍රාහකයින් 9 දෙනෙකු තෝරා ගනු ගනු ලැබීය.
- ආහාර හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා ක්ෂුද්‍ර/කුඩා පරිමාණ ව්‍යවසායකයින් 74 දෙනෙකු සහභාගී විය.
- ආහාර සහ වෙළඳ කාණ්ඩවල ක්ෂුද්‍ර/කුඩා/මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් 6 දෙනෙකු ජයග්‍රාහකයින් ලෙස තෝරාගෙන මුදල් ත්‍යාග පිරිනමන ලදී.













නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි අභ්‍යන්තර අරමුදලක් පිහිටුවීම

2021 වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණ

පසුගිය වසර කිහිපය තුළ විසඳිය යුතුව තිබූ ගැටළුවක් වූ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර අරමුදල පිහිටුවීම සම්බන්ධව මේ වන විට විසඳුමක් ලබා ගැනීම 2021 වර්ෂය වන විට අත් කර ගත් තවත් ජයග්‍රහණයකි.

හා මූලික පියවර ලෙස අධිකාරිය පිහිටුවීමේ පනතේ ෂෂ කොටසේ අංක 16ට අනුකූලව අභ්‍යන්තර අරමුදල සම්බන්ධව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය තුළ කමිටුවක් පිහිටුවා අධිකාරිය සඳහා අභ්‍යන්තර මූල්‍ය ප්‍රතිපත්තියක් සකස් කරන ලදී.

පසුව අධිකාරියේ අභ්‍යන්තර අරමුදල පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් විමසන ලද අතර එයට ප්‍රතිචාර ලෙස මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙතින් විමසීමක් කර ඒ අනුව නීති නීති කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ලද නිර්කෂණයන්ට මත රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතේ ප්‍රතිපාදන අනුව අධිකාරිය සඳහා අරමුදලක් පිහිටුවීමට හැකි විය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් සිදුකල සමීක්ෂණ

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත බල ප්‍රදේශ අනුව හඳුනාගනු ලැබූ අඩු පහසුකම් සහිත නාගරික ජනාවාස ප්‍රජාව සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් භෞතික සංවර්ධනය හා මානව සංවර්ධනය අරමුණු ඇතිව ක්‍රියාත්මක කරන ලද, ක්‍රියාත්මක වෙමින් පවතින හා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ගණනාවක් පවතී.

එබැවින් වඩාත් පුළුල්ව මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් යෝජිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබූ නාගරික අඩු පහසුකම්



ජනාවාස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ සමාජ හා ආර්ථික සමීක්ෂණයට අදාළ තොරතුරු 2021.12.31 වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 208කින් ලැබී ඇති අතර එය 96%ක ප්‍රතිශතයක් ලෙස දැක්විය හැකිය.

දීප ව්‍යාප්ත නිවාස හා සමාජ ආර්ථික සමීක්ෂණය

මෙම දීප ව්‍යාප්ත සමීක්ෂණයේදී අඩු අදායම්ලාභී නිවාස ඒකකවල ස්වභාවය අනුව පැල්පත් , මුඩුක්කු, පේළි නිවාස, ප්‍රමිතිගත නොවන විසිරි පවතින නිවාස, දැඩි අවදානම් ප්‍රදේශවල පවතින නිවාස සහ වෙනත් නිවාස ලෙස නිවාස ඒකක හයකට වර්ගීකරණය කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලැබී ඇති දත්ත අනුව සාරාංශයක් ලෙස පේළි නිවාස ඒකක ප්‍රතිශතයක් ලෙස 29% ක් ද වෙනත් නිවාස ඒකක ප්‍රතිශතයක් ලෙස 27% ක් ද ප්‍රමිතිගත නොවන විසිරි පවතින නිවාස, දැඩි

අවදානම් ප්‍රදේශවල පවතින නිවාස, පැල්පත් නිවාස ඒකක ප්‍රතිශතයක් ලෙස



පිලිවෙලින් 18%, 12% සහ 12% ලෙස ද අඩු අදායම්ලාභී නිවාස වලින් සුළුතරයක් මුඩුක්කු නිවාස වන අතර එය ප්‍රතිශතයක් ලෙස 2% කි.

තවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ලැබී ඇති ඉඩම් සම්බන්ධ තොරතුරු මත ඉදිරියේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නිවාස ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් පවතින්නේ දැයි පරීක්ෂා කෙරෙමින් පවතින අතර

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැලිසර" හයිටිස් "මධ්‍යම අදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය සඳහා පවතින ඉඩම ද මෙම දීප ව්‍යාප්ත සමීක්ෂණයේ ප්‍රතිපලයකි.

ඊට අමතරව මෙම සමීක්ෂණයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට ලැබුණු සියලු දත්ත ගබඩා කිරීමේ ක්‍රියාවලියක් ලෙස දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක් ද (ෟඒඊඊ ඒබ්ටැපැබඒ ඊහිඑප) සකස් කරන ලදී.

සහාධිපත්‍ය නිවාස සමීක්ෂණය

තිරසාර නාගරීකරණයක් වෙනුවෙන් පුළුල් ලෙස පිළිගත් සංකල්පයක් වන සංයුක්ත නගර සැලැස්ම මගින් නාගරික තිරසර භාවය සඳහා නේවාසික පැවැත්ම උදෙසා සහාධිපත්‍ය නිවාසකරණය ඉතා වැදගත් අංගයක් වේ. මෙය ආර්ථික ප්‍රතිලාභයක් අත්කර දෙන තිරසර රාමුවක් තුල සිදුවිය යුතු අතර මෙමගින් නාගරික සමාජය හා පාරිසරික අවශ්‍යතා අතර සමතුලිත ඇති කරනු ලැබේ.

නිවාස පහසුකම් සැපයීමේ දී පෞද්ගලික අංශයේ සහාධිපත්‍ය නිවාසකරණය සඳහා මැදිහත් වීම කැපී පෙනෙන අතර මෙවැනි සහාධිපත්‍ය ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීමේදී ගැනුම්කරුවන්ට මෙන්ම සංවර්ධකයින්ටද පහසුකම් සැලසීම අත්‍යාවශ්‍ය වේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සැලසුම් හා අධීක්ෂණ අංශය විසින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවර්ධකයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් අවසන් කරන ලද හෝ ඉදිකිරීම් සිදුකරමින් පවතින සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘති වල තොරතුරු රැස් කිරීම සඳහා මෙම සහාධිපත්‍ය සමීක්ෂණය සිදුකරන ලදී.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සැලසුම් හා අධීක්ෂණ අංශය විසින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවර්ධකයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් අවසන් කරන ලද හෝ ඉදිකිරීම් සිදුකරමින් පවතින සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘති වල තොරතුරු රැස් කිරීම සඳහා මෙම සහාධිපත්‍ය සමීක්ෂණය සිදුකරන ලදී.

ඒ සඳහා දිපව්‍යාප්තව රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවර්ධකයින් 173ක ගේ දත්ත



රැස්කිරීම සිදුකරන ලද අතර බහු මාදිලියේ සන්නිවේදන ක්‍රම

භාවිත කරමින් කොටස් 03කින් සමන්විතව 01 . මූලික තොරතුරු ලබාගැනීම 02. නිවාස ව්‍යාපෘති වල නිවාස ලක්ෂණ 03. ගැණුම්කරුවන් සඳහා සහනදායී ප්‍රතිලාභ ලබාදීම යන කරුණු පදනම් කර ගනිමින් මෙම ප්‍රශ්නාවලිය සකස් කරන ලදි.

එකී දත්ත පදනම්ව නිවාස ව්‍යාපෘතින් වලින් 93%ක් කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති අතර එයින් 60%ක ප්‍රමාණයක 13 - 62 අතර නිවාස ඒකක පවතින බවත්, එම නිවාස ඒකකයන් හි රු.මි. 11 - රු.මි.15 ත් අතර අලෙවි මිල තීරණය වන බවත් එයින් 24%ක් සඳහා නිවාස සංවර්ධිත ආයතන විසින් නිවාස ඒකක වලට ගෙවීම කිරීමට බැංකු ණය ලබාදී ඇති බවත් තහවුරු කර ගන්නා ලදි.







මානව සම්පත් සංවර්ධන සහ ආයතන කළමනාකරණය සංවර්ධන කටයුතු

2021.12.31 දක්වා ක්‍රියාත්මක කල පුහුණු වැඩසටහන්

පාඨමාලාව	ආයතනයේ නම	පාඨමාලා කාලසීමාව	අංශය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
Leaders for Tomorrow	නිපුණතා සංවර්ධන අරමුදල	එක් දින වැඩමුළුව	මාධ්‍ය අංශය හා අයකිරීම් අංශය	03
Advanced Microsoft Excel Training for Data Analysis	නිපුණතා සංවර්ධන අරමුදල	දින 3	මාධ්‍ය අංශය, සභාපති කාර්යාලය හා සැලසුම් හා අධීක්ෂණ අංශය	04
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	එක් දින වැඩමුළුව	ගිණුම් අංශය	02
ලිපිගොනුකරණය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	එක් දින වැඩමුළුව	පාලන අංශය	07
වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වය සඳහා වර්ධනය කරගත යුතු නායකත්ව ගුණාංග	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	එක් දින වැඩමුළුව	මධ්‍යමපාන්තික නිවාස ව්‍යාපෘති ඒකකය, මාධ්‍ය අංශය හා අයකිරීම් අංශය	04
රැස්වීම් කළමනාකරණ ශිල්පීය ක්‍රම	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	එක් දින වැඩමුළුව	මධ්‍යමපාන්තික නිවාස ව්‍යාපෘති ඒකකය හා මාධ්‍ය අංශය	03
Energy Management in High-rise Building	ICTAD	එක් දින වැඩමුළුව	ඉංජිනේරු අංශය හා පාන්තික නිවාස ව්‍යාපෘති ඒකකය	07
Sustainability of Standard Bidding Documents, Procurement Guidelines Manual 2006 to avoid delays issues and constraints in Construction Contract Administration	ICTAD	එක් දින වැඩමුළුව	ඉංජිනේරු අංශය හා මධ්‍යමපාන්තික නිවාස ව්‍යාපෘති ඒකකය	07

1. Leaders for tomorrow

නිපුණතා සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කළ බැංරි දෙර එදපදරරදඅ පුහුණු වැඩසටහන මාර්ග ගත තාක්ෂණය ඔස්සේ සිදු කරන ලද එක් දින පුහුණු වැඩමුළුවකි.

මෙම වැඩසටහන 2021 සැප්තැම්බර් මස 22 දිනැතිව පැවැත්වූ අතර, අප අධිකාරියෙහි මාධ්‍ය අංශයේ නිලධාරීන් දෙදෙනෙකු සහ අයකිරීම් අංශයේ එක් නිලධාරියෙකු ද ඇතුළුව සමස්ත නිලධාරීන් තිදෙනෙකු මේ සඳහා සහභාගී විය.

නායකත්ව භූමිකාව, අභියෝග හමුවේ නායකත්වය, ඵලදායී චින්තනය සහ කාර්යාලීය ආචාර විධි, පෞරුෂ වර්ධනය සහ කාල කළමනාකරණය පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම මෙම පුහුණු වැඩසටහනෙහි අරමුණ විය.

ඒ අනුව, සේවක පෞරුෂය ඉහළ නැංවීම සහ අභියෝග සඳහා සාර්ථකව මුහුණ දෙමින් තම නායකත්ව ගුණාංග ස්වයං වර්ධනයකට ලක් කිරීමට අවශ්‍ය වන්නා වූ දැනුම සහ කුසලතාවය වැඩි දියුණු කරගැනීමට මාර්ගෝ

ාපදේශ ලබා දීම මෙම නිලධාරීන් උක්ත පුහුණුව සඳහා යොමු කිරීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

2. Advanced Microsoft Excel Training for Data Analysis:

විෂය දැනුම සහ තාක්ෂණික ඥාණය කාර්යක්ෂම සේවා සැපයීමකදී අත්‍යාවශ්‍යය ගුණාංග වේ.මෙම කරුණ පදනම් කරගනිමින් කාර්ය මණ්ඩලය සතු විෂය දැනුම සහ තාක්ෂණික ඥාණය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් වෙත නිලධාරීන් යොමු කිරීම අප අධිකාරියෙහි පුළුල් අරමුණු සාක්ෂාත් කරගනු වස් මහඟු පිටිවහලකි.

මෙම අරමුණ මුලික කරගනිමින් දත්ත විශ්ලේෂණය සහ මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Microsoft Excel) මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමත්, නව දැනුම ලබාදීමත් සඳහා නිපුණතා සංවර්ධන අරමුදල මගින් සංවිධානය කරන ලද Advanced Microsoft Excel Training for data Analysis නම් පුහුණු පාඨමාලාව සඳහා අප අධිකාරියේ මාධ්‍ය අංශයේ නිලධාරීන් දෙදෙනෙක්, සභාපති කාර්යාලයේ නිලධාරියෙක්, සහ සැලසුම් හා කා.තො.ප අංශයේ නිලධාරියෙකු ද ඇතුළුව සමස්ත නිලධාරීන් සිව් දෙනෙක් සඳහා සහභාගී වීමේ අවස්ථාව ලබාදෙන ලදී.

3. රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම :

යම් සේවකයෙකු තම සේවාව ආයතනයක් වෙත ලබා දෙනුයේ එකී සේවයට අදාළ වේතනය පිළිබඳ අරමුණිනි. රාජ්‍ය සහ පෞද්ගලික යන ඕනෑම අංශයකට මෙය පොදු කරුණකි. රාජ්‍ය අංශයේ නිලධාරීන් සම්බන්ධයෙන් වන වේතන ගෙවීම් විධිමත් ක්‍රියාවලියකට සහ නෛතිකමය රාමුවකට යටත්ව සිදුවන්නකි.

මෙම දැනුම රාජ්‍ය නිලධාරීන් වෙත ලබා දීම පාදක කරගනිමින් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් 2021 සැප්තැම්බර් මස 16 වන දිනැතිව රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් මාර්ග ගත තාක්ෂණය ඔස්සේ සිදු කළ අතර, අප අධිකාරියෙහි ගිණුම් අංශයේ නිලධාරීන් දෙදෙනෙකු ඒ සඳහා සහභාගී විය.

රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් හා වැටුප් ව්‍යුහය, වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රම, වැටුප් පරිවර්තනය කිරීම සහ වැඩ බැලීමේ වැටුප් සහ දීමනා පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම පුහුණු වැඩමුළුවේ ප්‍රධානතම අරමුණු විය.

4. ලිපිගොනුකරණය

ආයතනයක රාජකාරීමය වශයෙන් වන ලේඛනයන් විධිමත්ව තබාගැනීම සහ යාවත්කාලීන කිරීම ආයතනික වහයෙන් වැදගත් කාර්‍යභාරයකි. එක් එක් විෂයට සමගාමීව ලේඛන ගොනු පවත්වාගැනීම, සංවිධානාත්මක අයුරින් සහ පිළිවෙල සුරැකෙන පරිදි අදාළ ගොනු නඩත්තු කිරීම පිළිබඳ දැනුම සේවකයා තුළ පැවතිය යුතු අත්‍යාවශ්‍ය ගුණාංග වේ.

ඒ අනුව ආයතනයේ සුවිශේෂී කාර්‍යභාරයක් ඉටුකරන අංශයක් වන පාලන අංශය වෙත නව පත්වීම් ලැබූ නිලධාරීන් 07 දෙනෙකු 2021.10.06 දිනැතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් සංවිධානය කරන ලද ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා යොමු කරන ලදී.

ලිපිගොනුකරණයේදී සැලකිලිමත් විය යුතු වැදගත් කරුණු, නිවැරදි ගොනු ක්‍රමයක ගුණාංග, නිවැරදිව පවත්වාගෙන යන ගොනුවක ඇති ප්‍රයෝජන, ලිපිගොනු වර්ගීකරණය, ලිපි සැකසීම සහ සටහන් ලිවීම පිළිබඳ නිවැරදි අවබොධයක් සහභාගීවන්නන්

වෙත ලබාදීමට මෙම පුහුණු වැඩසටහන යටතේ හැකියාව ලැබී ඇත.

5.වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වය සඳහා වර්ධනය කරගත යුතු නායකත්ව ගුණාංග

සෑම රාජ්‍ය නිලධාරියෙකු සතු විය යුතු අත්‍යාවශ්‍ය ගුණාංගයක් ලෙස නායකත්වය පිළිබඳ ශක්‍යතා ගුණය සඳහන් කළ හැකිය. වෘත්තීයමය වශයෙන් සාර්ථකත්වයට පත්වීම සඳහා මෙම ගුණාංගයෙහි දායකත්වය ඉතාමත් ඉහළ මට්ටමක පවතී.

ආයතනික වශයෙන් සිදුවන කුමන තත්වයක් යටතේ වුවද ගැටුම් කළමනාකරණය කරගනිමින් පෞරුෂ හානියක් නොවන පරිදි කටයුතු කිරීමේ හැකියාව නායකත්ව හැකියාව මගින් නිසඟයෙන්ම හිමිවේ. මෙම අරමුණ පාදක කරගනිමින් 2021.08.17 දිනැතිව ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් සංවිධානය කරන ලද වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වය සඳහා වර්ධනය කරගත යුතු නායකත්ව ගුණාංග සම්බන්ධයෙන් වන පුහුණු වැඩමුළුව සඳහා අප අධිකාරියෙහි මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියේ නිලධාරීන් 01 අයෙකු, මාධ්‍ය අංශයේ නිලධාරීන් දෙදෙනෙකු හා අයකිරීම් අංශයේ නිලධාරියෙකු සම්බන්ධ කරවීමට කටයුතු කරන ලදී.

6. රැස්වීම් කළමනාකරණ ශිල්පීය ක්‍රම

පිරිස් කළමනාකරණය සහ රැස්වීම් කළමනාකරණ හැකියාව ඕනෑම රාජ්‍ය සේවකයෙකු සතු විය යුතු අනිවාර්‍ය ගුණාංග යකි. පොදු මහජනතාව වෙනුවෙන් කාර්‍යක්ෂම සේවයක් ලබාදීම රාජ්‍ය සේවයේ ප්‍රමුඛතම අරමුණයි. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වන අප අධිකාරිය රාජකාරි මට්ටමින් සමාජීය වශයෙන් අන්තර් සම්බන්ධතා දැක්වීම ප්‍රධාන වශයෙන් සිදු කරයි. එකී කාර්‍යයෙදී රැස්වීම් කළමනාකරණ දැනුම ආයතන නිලධාරීන් තුළ පැවතීම ආයතනික අරමුණු සාර්ථක කරගැනීමෙහිලා සුවිශෙෂී දායකත්වයක් පෙන්නුම් කරන බව ප්‍රත්‍යක්ෂ කරුණකි.

ජාතික වැවිලි කළමනාකරණය ආයතනය මඟින් 2021.08.12 දිනැතිව රැස්වීම් කළමනාකරණ ශිල්ප ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුවක් පවත්වන ලද අතර, උක්ත කරුණු සාක්ෂාත් කරගැනීමෙහිලා අප අධිකාරියෙහි සේවයේ නියුතු මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති ඒකකයේ නිලධාරියෙකු සහ මාධ්‍ය අංශයේ නිලධාරීන් දෙදෙනෙකු එයට සම්බන්ධ කරවීමට අවශ්‍ය පියවර ගනු ලැබිණි.

7 Energy Management in High- rise Building

I I Sustainability of Standard Bidding Documents" Procurement Guidelines

Manual 2006 to avoid delays issues and constraints in Construction Contract Administration

ඉදිකිරීම් ක්ෂෙත්‍රයට අදාළ තාක්ෂණික දැනුම ලබාදීම අරමුණු කරගනිමින් සංවිධානය කරන ලද පුහුණු වැඩමුළු ද්විත්වයක් ලෙස ඉහත සඳහන් වැඩමුළු සඳහන් කළ හැකිය. මින්

(i) Energy Management in High- rise Building පුහුණු වැඩමුළුව 2021.09.28 දිනැතිව පැවැත්වූ අතර (ii) Sustainability of Standard Bidding Documents" Procurement Guidelines පුහුණු වැඩමුළුව 2021.09.30 වන දිනැතිව පවත්වන ලදී. අප අධිකාරියෙහි ඉංජිනේරු අංශයේ සහ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති ඒකකයේ නිලධාරීන් 07 දෙනෙකු මෙම පුහුණු වැඩමුළුවට යොමු කළ අතර, ඉහත ක්ෂෙත්‍රයන්ට අදාළ තාක්ෂණික දැනුම සාර්ථකව එම නිලධාරීන්ට ලබාදීමට හැකිවීම ආයතනික කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා වැදගත් වන්නක් බව පැවසිය හැක.

සේවක ශ්‍රේණිගත කිරීම් සිදු කිරීම

වසර 13ක කාලයක් අධිකාරියේ නිලධාරීන් වෙත ලබාදීමට අපොහොසත් වූ ශ්‍රේණිගත කිරීම් 2021 වර්ෂයේ දී ලබාදීමට හැකිවිය.

ඒ අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සේවා කාලය අනුව ශ්‍රේණිගත කිරීමට කටයුතු කරන ලදි. රීල් සමාගමේ හා නාගරික ජනවාස ප්‍රවර්ධන වැඩ සටහනේ සේවය කල කාර්ය මණ්ඩලය හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුල් බඳවා ගැනීම් සිදුකල කාර්ය මණ්ඩලයේ සේවා කාලය ඇගයීමක් මෙමඟින් සිදු වී තිබේ. එමගින් අධිකාරියේ නිලධාරීන් හට තම කාර්යයන් තෘප්තිමත්ව සිදුකිරීමේ කාර්යාලීය පරිසරයක් නිර්මාණය කිරීමේ හැකියාව ලැබිණි.

සේවක කාර්තුමය ඇගයීම් හඳුන්වා දීම

වාර්ෂික සේවක ඇගයීම් පමණක් වෙනුවට කාර්තුමය වශයෙන් සේවා ඇගයීම් කර කාර්තුමය ඇගයීම් අනුව වාර්ෂික ඇගයීම සිදුකිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදි. එමඟින් සේවකයින්ගේ දියුණු විය යුතු කරුණු සම්බන්ධයෙන් කාර්තුවක් තුල හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම හා ආකල්ප වෙනස් කිරීම බලාපොරොත්තු වේ.

අධිකාරිය සඳහා නව අයකිරීම් අංශයක් ඇතිකිරීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ එක් එක් අංශයන්ගෙන් සේවකයන් තෝරාගෙන පිහිටුවාගත් කණ්ඩායම 2020 වසර අවසන් වනතුරු ණය අයකර ගැනීමේ ක්‍රියාවලියේ නිරත විය. ආයතනයේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් එම ක්‍රියාවලියට කැපවූ අංශයක් අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ණය අයකර ගැනීමේ අංශය පිහිටුවන ලදී. දැනට, එහි සේවක සංඛ්‍යාව 11දෙනෙකුගෙන් යුක්ත වන අතර ඔවුන් එක් එක් අංශයන්ගෙන් තෝරාගත් සේවකයන් වේ.

අයකිරීම් අංශයේ මෙහෙයුම් යාන්ත්‍රණය පියවර 10කින් සමන්විත අඛණ්ඩ ක්‍රියාවලියකි. එය ප්‍රධාන වශයෙන් නීති අංශයට සහ ඉඩම් හා දේපළ කළමණාකරන අංශයට සම්බන්ධ වේ.

ණය අයකර ගැනීමේ ක්‍රියාවලියේදී නීත්‍යානුකූල නොවන පියවරයන් ආරම්භයටත් නීත්‍යානුකූල පියවරයන් පසුවටත් ඇතුළත් වේ.

නිවාස අවශ්‍යතා ඇති නාගරික ප්‍රජාවට ලබා දෙන ණය (නිවාස ණය) සහ ව්‍යවසායකයින් සඳහා වන ණය වශයෙන් (ව්‍යවසායකත්ව සංවර්ධන ණය) ණය දෙවර්ගය ණය ගොනුවට ඇතුළත් වේ. නිවාස ණය ප්‍රධාන ණය කාණ්ඩ දෙකකින් සමන්විත වේ: ඉන් එක් කාණ්ඩයක් ණය පදනම මත සම්පූර්ණ කරන ලද නිවාස වන අතර අනෙක් කාණ්ඩය වන්නේ ප්‍රමිතිගත නොවන නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීම සඳහා ලබා දෙන ණයයි.

දැනට, ණය ගොනුව නිවාස ණය 1,078 කින් සහ ව්‍යවසායකත්ව සංවර්ධන ණය 732 කින් සමන්විතය. ව්‍යාපෘති පෙළ ගැස්වීමට අනුව තවත් 2,000ක ණය ප්‍රමාණයක් ණය ගොනුවට එකතු වේ





ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය තුළ මාර්ගගත ණය අයකරගැනීමේ ක්‍රමවේදය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) මඟ පෙන්වීම මගපෙන්වීම

දැනට පවත්නා ස්වයංක්‍රීය නොවන ක්‍රමය (Manual) වෙනුවට මාර්ගගත ක්‍රමය හරහා ණය අයකර ගැනීමේ හැකියාව වැඩි කිරීම, "නිවසේ සිට වැඩ කිරීමේ" සංකල්පය, " මාර්ගගත කාර්යාල" සහ "දුරස්ථ කාර්යය" වැනි අවදානම් සහගත අවස්ථාවලදී එම ක්‍රමයන්ගෙන් වාසි ලබා ගැනීමට (කොවිඩ් 19 වැනි අවදානම් සහගත තත්ත්වයන් තුළ) සහ ණය විස්තර සඳහා අදාළ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රවේශය වර්ධනය කිරීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකාරීත්වය විසින් යෝජිත ව්‍යාපාර සම්පත් සැලසුම් කරන පද්ධතිය (ERP)සමඟ මාර්ගගත ණය අයකර ගැනීමේ ක්‍රමය හඳුන්වා දීමට තීරණය කරන ලදී.

පළමුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ සාකච්ඡා පවත්වන ලද්දේ රජයේ ජාතික ඩිජිටල් මුලාරම්භය (National Digital Initiative) සඳහා පිහිටුවා ඇති එහි රෙගුලාසිවලට අනුකූල වීම සඳහා ය. ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසු සුදුසු මෘදුකාංග විසඳුම් ලබා ගැනීමට ICTA උපදෙස් දෙන ලදී. දැනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

අධිකාරිය සඳහා නව ප්‍රවාහන හා නඩත්තු අංශයක් ඇතිකිරීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි උන්නතිය හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රාජකාරී මෙහෙයවමින් විධිමත් පාලන පද්ධතියක් පිළියෙල කර ගැනීම සහ අධිකාරියෙහි කාර්යක්ෂමතාව වර්ධනය කරගනු වස් වඩා ඵලදායී සේවාවක් සැපයීම යන අභිලාෂයන් පෙරදැරි කරගනිමින් පරිපාලන අංශය අංශ දෙකක් ලෙස එනම්, පාලන (මානව සම්පත් සංවර්ධන) අංශය හා පාලන (ප්‍රවාහන හා නඩත්තු) අංශය ලෙස ප්‍රතිව්‍යුහ ගත කරන ලදී.

මෙම සියලු කාර්යයන් සාර්ථකව හා කඩිනමින් ඉටු කර ගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම හා නඩත්තු කටයුතු පාලන (ප්‍රවාහන හා නඩත්තු) අංශය මගින් සිදුකරනු ලබයි.

මෙහි ව්‍යුහය නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන (ප්‍රවාහන හා නඩත්තු) ඇතුළු කාර්යය මණ්ඩල නිලධාරි තිදෙනෙකු ගෙන් හා රියදුරු මහතුන් දස දෙනෙකුගෙන් සමන්විත වේ. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රවාහන හා නඩත්තු අංශය වාහන 10කින් සමන්විත වන අතර එය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සතු වාහන 06ක් හා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන 04ක් ලෙස වේ. මෙම වාහන 10 න් මාණ්ඩලික නිලධාරීන් වෙත ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා වාහන 05ක් යොදවා ඇති අතර ඉතිරි වාහන 05 යොදවා ගනිමින් සියලු අංශයන්හි රාජකාරී කටයුතු ආවරණය කිරීම සිදුකරනු ලබයි.

අධිකාරියේ ප්‍රවාහන හා නඩත්තු කටයුතු විධිමත්ව සිදුකිරීම සඳහා ස්ථාපිත කරනු ලැබූ මෙම අංශයේ සාර්ථකත්වය විදහා දක්වමින් අංශය විසින් අධිකාරියේ ප්‍රවාහන හා නඩත්තු කාර්යයන් කඩිනම් හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා නව අයදුම්පත් ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබිය. එනම් , ප්‍රවාහන හා නඩත්තු අංශය විසින් අධිකාරිය මින් පෙර භාවිත කර ඇති වාහන අයදුම් පත්‍රය වෙනුවට විධිමත් නව අයදුම්පත්‍රයක් හඳුන්වා දෙන දිම.

අධිකාරිය විසින් දිස්ත්‍රික්ක 16ක් පුරා සිදුකරනු ලබන නාගරික අඩු ආදායම්ලාභී ජනතාව නඟා සිටුවීමේ මානව සංවර්ධන වැඩසටහන් සඳහා සහ වෙනත් පරිපාලනමය කටයුතු සඳහා ද ප්‍රවාහන පහසුකම් සැපයීම කළමනාකරණය කර ගැනීමට නොහැකි අවස්ථාවලදී මෙම අංශය විසින් කුලී රථ භාවිත කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

එසේම ප්‍රවාහන හා නඩත්තු කාර්යන් සඳහා වෙනම සුළු මුදල් අග්‍රිමයක් ලබාගත් අතර, ඒ සඳහා ද අයදුම්පත්‍රයක් හඳුන්වා දිම.

ඉහත සඳහන් කර ඇති නව ක්‍රමවේදයන් මගින් රාජකාරී කටයුතු පහසුවෙන් හා විනිවිධභාවයකින් යුතුව ඉටුකර ගැනිම මෙන්ම අධිකාරිය විසින් දියත් කරනු ලබන සියලුම



වැඩසටහන් සඳහා කාර්යක්ෂම හා වඩාත් ඵලදායි ලෙස ප්‍රවාහන පහසුකම් සැපයිමට හා අංශයන් වල පවතින නඩත්තු කටයුතු ද කඩිනම්ව සිදුකිරිමට මෙම අංශය පිහිටුවිම මගින් හැකියාව ලැබී ඇත .

අධිකාරිය සඳහා නව තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය අංශයක් ඇතිකිරීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි උන්නතිය හා ඉලක්ක සාක්ෂාත් කර ගැනිම සඳහා සිදු කෙරෙන වැඩසටහන් මහාජනතාවට වඩාත් වේගයෙන් තොරතුරු ග්‍රහණය කිරීම හා වාඩාත් කාර්යක්ෂම හා යාවත්කාලින වූ තොරතුරු තාක්ෂනික පද්ධතියක් ආයතන තුල ගොඩනැගිම හා පවත්වා ගැනිම යන කාරණා මුල් කොට ගනිමින් තොරතුරු තාක්ෂණික හා මාධ්‍ය අංශය ගොඩ නගනු අතර මෙම අංශය අංශ ප්‍රධානියෙකු හා නිලධාරි තිදෙනෙකුගෙන් සමන්විත වේ. ඒ අනුව මෙම අංශයෙහි පරමාර්ථය හා කාර්යභාරය පහත පරිදී දැක්වේ.

1. තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය ඒකකය පිහිටුවීමේ පරමාර්ථ

1.1 පරමාර්ථය (මාධ්‍ය ඒකකය)

1. මහජනතාවට වඩාත් වේගවත් තොරතුරු ග්‍රහණය වන පරිදි තොරතුරු සංවිධානය සහ ආකර්ෂනීය ලෙස පෙළගැස්වීම සිදුකිරීම.

2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබන, ජාතික වශයෙන් වැදගත් වූ සියළු සංවර්ධන ව්‍යාපෘති සහ අනෙකුත් විශේෂ ව්‍යාපෘති පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.

3. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්යයන්ට අදාළව අනෙකුත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන විසින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.

4. ආයතනය තුළ නිවැරැදි දත්ත සහ තොරතුරු ව්‍යාප්ත වන පරිදි ජනමාධ්‍ය සහ තොරතුරු තාක්ෂණ සංස්කෘතියක් ගොඩ නැගීම.

5. ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය සහ ඒකකය තුළ භෞතික සහ මානව සම්පත් සංවර්ධනය කිරීම.

1.2 පරමාර්ථ (තොරතුරු තාක්ෂණ)

1) වඩා කාර්යක්ෂම හා යාවත්කාලීන වූ තොරතුරු තාක්ෂණ පද්ධතියක් (ERP) ආයතනය තුළ ගොඩනැගීම හා පවත්වා ගැනීම.

2) ආයතනයේ සියළුම අංශ සම්බන්ධීකරණ වන අන්දමින් තොරතුරු පද්ධතියක් ගොඩා නැගීම.

3) ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.

4) ආයතනයේ සියළුම මෙහෙයුම් කටයුතු තොරතුරු තාක්ෂණ මගින් සිදුකිරීම හා වඩාත් නවීකරණය වූ තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ සංස්කෘතියක් ආයතනය තුළ ස්ථාපිත කිරීම.

මෙම අංශයෙහි සිදු කෙරන වැඩ සටහන් නව තාක්ෂණ ඔස්සේ ක්‍රමානුකූල නව මුහුණු වරක් වශයෙන් සිදු කිරීමටත් ආයතනය මගින් සිදු කෙරෙන ජාතික වැඩසටහන් ඉතාමත් වෙගයෙන් මහා ජනතාව වෙත ලගා කිරීමට මෙම අංශය දායක වී තිබේ.

මාසික ධර්ම දේශනා වැඩසටහන

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය කාර්යබහුලත්වයෙන් මුදවා අධ්‍යාත්මික ගුණයන් ගෙන් ඔවුන්ව සුපෝෂණය කිරීම උදෙසා ධර්ම කථිකයාණන් වහන්සේ නමක් අධිකාරිය වෙත වැඩම කරවා සෑම මසකම පුරපසලොස්වක පොහොය දිනට පෙර දින සුමුදුර ධර්මදේශනා වැඩසටහනක් පැවැත්වීම සිදුකරනු ලබයි.

මේ සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ එක් එක් අංශයන් මගින් ඔවුන්ට අදාල මාසයේ ධර්ම දේශනා මාලාව සංවිධානය කරනු ලබන අතර එම ධර්ම දේශනයන් ශ්‍රවණය කිරීමට අධිකාරියේ සෑම නිලධාරියෙකුටම අවකාශය සලසා දී තිබේ. මෙම වැඩසටහන් තුළින් අංශ අතර සහජීවනය වර්ධනය වීමට රුකුලක් වේ.

අධිකාරියේ නිලධාරීන් පරිබාහිර ලෝකයෙන් මිදී මානසික සුවය උදෙසා අධ්‍යාත්මික ජීවිතයේ ගුණ ධර්මයන් වර්ධනය කර ගැනීමට මෙම මාසික ධර්මදේශනා වැඩසටහන මහත්වූ පිටිවහලක් වනු ඇත.









අධිකාරියහි කාර්යක්ෂමතාව උපරිම අයුරින් පවත්වාගැනීම සඳහා පුරප්පාඩුව පැවති කාර්යය මණ්ඩලය බඳවා ගැනීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියහි කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකරගැනීම සඳහා කාලයක් තිස්සේ පුරප්පාඩුව පවති තනතුරු පිරවීමට ස්ථිර පදනමින් නව කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීම 2021 වසරේදී සිදුකරන ලදී.

පහත සඳහන් තනතුරු වල පුරප්පාඩු සඳහා 2021 වර්ෂයේ ජූලි හා දෙසැම්බර් මාස වලදී නව බඳවා ගැනීම් හා අභ්‍යන්තර උසස්වීම් අවස්ථා ලබා දීමට කටයුතු කරන ලදී.

තනතුර	තනතුර	පුරප්පාඩු
1	සහකාර අධ්‍යක්ෂ(ඉඩම්)	01
2	සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)	01
3	සංවර්ධන නිලධාරි	02
4	දත්ත සැකසුම් සහකාර	01
5	සැලසුම් සහකාර (ක.තො.ප.)	01
6	ප්‍රජා සංවර්ධන සහකාර	12
7	තාක්ෂණික සහකාර	02
8	සමාජ සංවර්ධන සහකාර	13
9	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	06

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2021.12.31 දිනට කාර්ය මණ්ඩලය

#	තනතුර	වැටුප් කාණ්ඩය	අනුමත ප්‍රමාණය		දැනට සිටින ප්‍රමාණය		සුරක්ෂාධූ	අතිරික්ත
			ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්		
01	අධ්‍යක්ෂ ජනරාල්	HM2-1	01	-	01	-	-	-
02	අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ)	HM1-1	01	-	01	-	-	-
03	අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප)	HM1-1	01	-	01	-	-	-
04	අධ්‍යක්ෂ (මුදල්)	HM1-1	01	-	01	-	-	-
05	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	HM1-1	01	-	-	-	01	-
06	අභ්‍යන්තර විගණක	MM1-1	01	-	01	-	-	-
07	සහකාර අධ්‍යක්ෂ (මුදල්)	MM1-1	01	-	01	-	-	-
08	සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)	MM1-1	01	-	01	-	-	-
09	සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)	MM1-1	01	-	01	-	-	-
10	සහකාර අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා)	MM1-1	01	-	01	-	-	-
11	සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ)	MM1-1	03	-	03	-	-	-
12	සහකාර අධ්‍යක්ෂ (නීති)	MM1-1	01	-	01	-	-	-
13	සහකාර අධ්‍යක්ෂ (ඉඩම්)	MM1-1	01	-	-	-	01	-
14	සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)	MM1-1	01	-	-	-	01	-
15	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)	MM1-1	01	-	01	-	-	-
16	පරිපාලන නිලධාරි	JM1-1	01	-	01	-	-	-
17	තාක්ෂණ නිලධාරි	JM1-1	01	-	01	-	-	-
18	ඉංජිනේරු සහකාර	JM1-1	01	-	-	-	01	-
19	සංවර්ධන නිලධාරි	MA5-1	08	-	08	-	-	-
20	පද්ධති විශ්ලේෂක	MA5-1	01	-	01	-	-	-
21	සැලසුම් සහකාර	MA5-1	01	-	01	-	-	-
22	දත්ත සැලසුම් සහකාර	MA5-1	01	-	01	-	-	-
23	සැලසුම් සහකාර (ක.තො.ප)	MA5-1	01	-	01	-	-	-
24	සැලසුම් සහකාර (පර්යේෂණ)	MA5-1	01	-	01	-	-	-
25	සැලසුම් සහකාර (සංඛ්‍යාන)	MA5-1	01	-	01	-	-	-
26	නීති සහකාර	MA3	01	-	01	-	-	-
27	ප්‍රජා සංවර්ධන සහකාර	MA3	30	-	21	-	09	-
28	තාක්ෂණික සහකාර	MA2-1	13	-	10	-	03	-
29	සැලසුම් ශිල්පි	MA2-1	01	-	01	-	-	-
30	ක්‍රමලේඛක	MA2-1	01	-	01	-	-	-
31	කළමනාකරණ සහකාර (තා.නො)	MA1-1	27	-	26	-	01	-
32	දත්ත සටහන් ක්‍රියාකරු	MA1-1	02	-	01	-	01	-

33	සමාජ සංවර්ධන සහකාර	MA1-1	20	-	19	-	01	-
34	රියදුරු	PL3	10	-	10	-	-	-
35	ඉදිකිරීම් අධීක්ෂණ සහයක (කොන්ත්‍රාත්)	PL3	-	16	-	-	16	-
36	කාර්යාල කාර්ය සහයක	PL1	12	-	10	-	02	-
37	ලේඛන භාරකරු	PL1	01	-	-	-	01	-
38	ගබඩාභාරකාර සහායක	PL1	01	-	01	-	-	-
39	සංචාරක බංගලා භාරකරු/ මුරකරු (කොන්ත්‍රාත්)		-	-	-	-	-	01
	එකතුව		**153**	**16**	**131**	**0**	**38**	**01**
යෝජිත මධ්‍යම අදායම් නිවාස ව්‍යාපෘතිය සඳහා								
40	අධ්‍යක්ෂ (මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය)	-	-	01	-	-	01	-
41	නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් පරිපාලන)	-	-	01	-	-	01	-
42	ප්‍රමාණ සම්ක්ෂක	-	-	01	-	01	-	-
43	තාක්ෂණ නිලධාරී (නගර සැලසුම්කරු)	-	-	02	-	-	02	-
44	කණිෂ්ඨ ප්‍රමාණ සම්ක්ෂණ	-	-	02	-	-	02	-
45	ඉඩම් නිලධාරී	-	-	01	-	-	01	-
46	තාක්ෂණික නිලධාරී (සැලසුම් ශිල්පී)	-	-	01	-	-	01	-
47	අතිරේක අධ්‍යක්ෂ (තාක්ෂණ)	-	-	01	-	-	01	-
48	ගෘහ නිර්මාණ ශිල්පී	-	-	01	-	-	01	-
49	ඉංජිනේරු (සිවිල්/ විදුලි/ සේවා)	-	-	02	-	-	02	-
	එකතුව		**-**	**13**	**-**	**01**	**12**	**-**
	මුළු එකතුව		**153**	**29**	**131**	**01**	**50**	**01**

❖ **මුළු ස්ථිර සේවක සංඛ්‍යාව = 131 (සභාපතිතුමා නොමැතිව)**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2021-12-31 දිනට

	සටහන	2021	2020
වත්කම්	-	රු	රු
ජංගම වත්කම්			
මුදල් හා බැංකු ශේෂය	**01**	56,179,922.48	48,644,361.79
මුදල් අත්තිකාරම්	**02**	322,086.32	56,050.50
උත්සව අත්තිකාරම්		33,750.00	20,000.00
ඉන්ධන අත්තිකාරම්		354,980.00	354,980.00
සේවක නිවාස ණය		1,935,848.55	4,991,778.08
සේවක ආපදා ණය		8,740,266.91	12,096,737.39
සුබසාධන ණය		10,000.00	10,000.00
අධ්‍යාපන ණය		125,383.77	187,375.17
ලැබිය යුතු සේවා ගාස්තු- නාගරික සංවරධන අධිකාරිය		207,331,767.00	207,331,767.00
ලැබිය යුතු ණය- විසිරි නිවාස (2022 වසර)		6,047,908.85	6,472,020.26
ලැබිය යුතු ණය හා වෙනත්	**03**	442,935,419.06	178,386,457.28
ඉදිකිරීම් අත්තිකාරම්	**04**	1,323,113.95	3,470,278.62
ජංගම වෙළඳ කුටි තොගය		41,000.00	-
සම්පත් මධ්‍යස්ථාන තොග	**05**	687,105.50	687,105.50
හලාවත නිවාස ව්‍යාපෘතිය		25,804,236.85	25,804,236.85
තලවකැලේ නිවාස ව්‍යාපෘතිය (08 ඒකක)		10,280,321.40	11,565,361.57
අනුරාධපුර (තුරුඉතුරුගම) නිවාස තොගය (03 ඒකක)		2,451,601.27	2,451,601.27
48 වත්ත නිවාස තොගය (15 ඒකක)		36,625,000.00	36,625,000.00
සහස්පුර වාණිජ ඒකක		44,777,000.00	-
ලුනාව නිවාස ඒකක තොගය (180 ඒකක)		651,016,306.14	-
ලුනාව නිවාස ව්‍යාපෘති තොගය	**06**	94,611,202.05	-
		1,591,634,220.10	**539,155,111.28**

ආයෝජන	**07**	**916,500,000.00**	-
ජංගම නොවන වත්කම්			
ණය තොගය	**08**	429,042,347.01	452,413,775.47
කෙරීගෙන යන වැඩ	**09**	13,221,994.17	1,275,884,524.44
දේපළ, පිරියත හා උපකරණ	**10**	51,107,430.91	63,229,215.42
අස්පෘශ්‍ය වත්කම්			
ගිණුම්කරණ පැකේජය		500,000.00	500,000.00
		493,871,772.09	**1,792,027,515.33**
මුළු වත්කම්		**3,002,005,992.19**	**2,331,182,626.61**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	**11**	112,830,040.83	37,588,544.50
කළමනාකරණ සංස්ථා අරමුදල- අගුලාන		30,000.00	-
කළමනාකරණ සංස්ථා අරමුදල- ලුනාව		21,900,000.00	-
කළමනාකරණ සංස්ථා අරමුදල- සිංහපුර		2,671,854.45	-
කළමනාකරණ සංස්ථා අරමුදල- වදුල්ලවත්ත		1,780,000.00	-
රඳවා ගැනීම් - ඉදිකිරීම් ව්‍යාපෘති	**12**	305,822.60	1,344,641.65
ගෙවිය යුතු ගිණුම- රීල් සමාගම		-	7,107,859.84
විසිරී නිවාස ණය - ඉදිරියට ලද වාරික මුදල්		-	141,957.79
තුරුඉතුරුගම - ඉදිරියට ලද වාරික මුදල්		-	181,902.50
තලවකැලේ- ඉදිරියට ලද වාරික මුදල්		15,000.00	-
සහස්පුර- ඉදිරියට ලද වාරික මුදල්		-	12,794.39
හලාවත- ඉදිරියට ලද වාරික මුදල්		86,346.28	76,224.14

හම්බන්තොට සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන		4,514,970.13	4,514,970.13
ලුනාව මූලික ගෙවීම් අයකිරීම		140,605,000.00	-
නැවත ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු		10,000.00	-
විලම්භිත ප්‍රදාන ආදායම් (ලුනාව)		751,106,192.09	-
භාණ්ඩාගාර ණය ගෙවීම්		125,016,000.00	-
		1,160,871,226.38	**50,968,894.94**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන් කිරීම		25,147,323.00	21,332,285.50
ආපදා ණය අරමුදල් වෙන් කිරීම		15,000,000.00	5,694,754.65
		40,147,323.00	**27,027,040.15**
මුළු වගකීම්		**1,201,018,549.38**	**77,995,935.09**
ශුද්ධ වත්කම්		**1,800,987,442.81**	**2,253,186,691.52**
ස්කන්ධය හා සංචිත			
භාණ්ඩාගාර ප්‍රදාන	**13**	716,109,824.18	1,993,016,243.85
ස්ථාවර වත්කම් සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන	**14**	5,745,875.31	5,300,102.84
භාණ්ඩාගාර ප්‍රදාන- මානව සංවර්ධන වැඩසටහන්		6,285,000.00	6,285,000.00
ඒකාබද්ධ අරමුදල		6,641,977.00	6,641,977.00
රාජ්‍ය ප්‍රදාන	**15**	108,034,839.91	68,332,962.51
ආදායම් සංචිත		36,625,000.00	36,625,000.00
ප්‍රත්‍යාගණන සංචිතය		39,259,145.55	39,318,995.55
		918,701,661.95	**2,155,520,281.75**

ශේෂ ආදායම (වියදම) ඉ/ගෙ		97,666,409.77	95,495,953.88
කාල පරිච්ඡේදය සඳහා ආදායම් (වියදම්) අතිරික්තය		784,619,371.09	2,170,455.89
		882,285,780.86	**97,666,409.77**
මුළු ප්‍රාග්ධනය		**1,800,987,442.81**	**2,253,186,691.52**

පිටු අංක 02 සිට 05 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 01 සිට 17 දක්වා වූ ගිණුම් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාරය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නාගරික ජනාවාස සංවරධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

Director Finance U.S.D.A	Director General U.S.D.A	Chairman U.S.D.A	Board of Director U.S.D.A
අධ්‍යක්ෂ (මුදල්) නා.ජ.ස.අ	අධ්‍යක්ෂ ජනරාල් නා.ජ.ස.අ	සභාපති නා.ජ.ස.අ	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික නා.ජ.ස.අ

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
2021-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාරය සාධන වාර්තාව

	සටහන	2021	2020
ආදායම්		රු	රු
භාණ්ඩාගාර ප්‍රදාන -පුනරාවරථන		155,000,000.00	128,999,635.00
භාණ්ඩාගාර ප්‍රදාන-මානව සම්පත් වැඩසටහන		26,980,000.00	11,000,000.00
විලම්භිත ආදායම්-ස්ථාවර වත්කම්		3,233,180.83	3,371,876.55
පොලී ආදායම්	16	22,129,237.43	7,087,416.94
වෙනත් ආදායම්	17	5,736,455.95	3,013,726.22
ලුනාව නිවාස ව්‍යාපෘතියේ ආදායම		766,350,947.45	-
වාහන විකුණුම් ලාභය		14,597,164.70	-
භාණ්ඩාගාර ප්‍රදාන - හොරණ නිවාස ව්‍යාපෘතිය		8,804,705.87	-
මුළු ආදායම		**1,002,831,692.23**	**153,472,654.71**
වියදම්			
පරිපාලන වියදම්			
වැටුප්		73,917,036.47	66,720,994.31
අතිකාල වියදම්		4,867,094.11	2,820,715.50
වෙනත් දීමනා		1,793,050.00	601,096.24
නිල ඇඳුම් දීමනා		64,500.00	-
සේවක දිරිදීමනා		1,755,000.00	-
අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු		970,000.00	461,000.00
ගමන් වියදම් (දේශීය)		426,040.57	479,134.91
ගමන් වියදම් (විදේශීය)		-	3,500.00
ලිපිද්‍රව්‍ය		5,135,428.19	4,748,851.91
ඉන්ධන		4,046,941.99	2,596,096.38
සුභසාධන		1,135,732.00	757,243.36

පුවත්පත් වියදම්		26,630.00	48,330.00
මුද්දර		169,302.50	183,605.00
උත්සව වියදම්		562,424.75	-
බැංකු ගාස්තු		2,166.00	-
දුරකතන වියදම්		1,300,489.58	1,784,849.09
කාරයාල කුලිය		21,501,385.20	14,944,001.46
කාරයාල උපකරණ(අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)		1,356,566.68	1,214,405.90
වාහන (අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)		3,519,907.48	2,540,602.62
ලී බඩු (අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)		-	2,000.00
ගොඩනැගිලි (අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)		2,824,239.08	3,431,457.00
පරිගණක (අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)		326,300.00	-
වාහන රක්ෂණය		587,301.61	599,073.64
පිරිසිදු කිරීමේ වියදම්		957,744.00	877,932.00
පුහුණු කිරීමේ වියදම්		830,740.00	518,820.00
මුද්‍රණ වියදම්		2,500,735.00	29,300.00
ප්‍රචාරණ වියදම්		856,102.50	101,520.00
අනෙකුත් වියදම් (සැපයුම්)		1,236,965.55	1,114,239.50
අනෙකුත් වියදම් (සේවා)		530,894.74	229,646.00
විගණන ගාස්තු		1,000,000.00	1,000,000.00
සේවක අරථසාධක අරමුදල		9,275,940.92	8,567,646.55
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල		2,191,864.58	1,781,178.77
සේ.අ.සා අරමුදල (කොන්ත්‍රාත් පදනම)		-	206,101.31
සේ.නි.භා අරමුදල (කොන්ත්‍රාත් පදනම)		-	62,539.81
ආරක්ෂණ වියදම්		30,500.00	213,500.00
පාරිතෝෂික		4,512,017.50	1,160,079.00
විදුලි ගාස්තු		112.24	6,725.52
ජල බිල්පත් ගාස්තු		4,371.46	25,189.09
ණය අයකිරීම් කොමිස් ගෙවීම්		-	153,216.20

නීති වියදම්		323,872.67	455,555.00
අඩමාණ ණය		1,060,635.32	1,639,768.52
ක්ෂය වීම්	10	14,248,150.83	6,944,275.24
මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම (වාහන)		10,253,645.00	11,333,520.00
ප්‍රවාහන වියදම්		1,182,183.80	16,600.00
ණය අයකිරීමේ අංශයේ වියදම්		87,524.39	-
ආපදා ණය අරමුදල් ප්‍රතිපාදන		9,305,245.35	-
නවාතැන් පහසුකම් වියදම්		54,200.00	-
		186,730,982.06	**140,374,309.83**
සංවරධන වියදම්			
ලෝක ජනාවාස දින වැඩසටහන්		-	4,362,606.28
ස්වශක්ති මානව සංවරධන වැඩසටහන		22,047,013.63	6,167,014.14
අගුලාන නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්		524,880.00	-
අනුරාධපුර නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්		-	8,400.00
ශ්‍රී වික්‍රමපුර නිවාස ව්‍යාපෘතියේ වියදම්		253,785.66	-
තලවකැලේ නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම්		96,115.39	389,868.57
හොරණ නිවාස ව්‍යාපෘතියේ වියදම්		8,559,544.41	-
		31,481,339.09	**10,927,888.99**
මුළු වියදම්		**218,212,321.15**	**151,302,198.82**
කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය / (ඌනතාවය)		**784,619,371.09**	**2,170,455.89**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
2021-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2021	2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ලැබීම්		
භාණ්ඩාගාර ප්‍රදාන(පුනරාවරථන)	155,000,000.00	128,999,635.00
සංස්කෘතික කටයුතු දෙපාරතමේන්තුව	-	921,175.00
ලංකා බැංකුවේ විශේෂ උත්සව ණය(උත්සව අත්තිකාරම්)	-	1,490,000.00
අනෙකුත් ආදායම්	1,225,608.49	1,108,698.45
ඉතුරුම් තැන්පතු පොළී ආදායම්	146,864.27	543,060.47
ස්ථාවර තැන්පතු පොළී ආදායම්	8,722,329.47	-
නිවාස ව්‍යාපෘති විකුණුම් ආදායම්	792,330,000.00	45,000.00
මුදල් අත්තිකාරම්	321,436.32	2,744.50
	957,746,238.55	132,105,313.42
වියදම්		
වැටුප් හා අනෙකුත් දීමනා	90,358,484.07	77,381,515.64
අතිකාල හා ගමන් වියදම්	4,643,233.08	3,585,687.32
සේවා හා සැපයුම්	11,463,812.68	8,502,492.15
ගිවිසුම්ගත සේවා	30,700,702.05	44,030,991.25
නඩත්තු වියදම්	7,416,166.59	8,125,562.44
ණය අයකිරීම් කොමිස්	-	230,286.20
උත්සව අත්තිකාරම්	65,166.54	1,490,000.00
පාරිතෝෂික ගෙවීම්	696,980.00	554,879.50

	145,344,545.01	143,901,414.50
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**812,401,693.54**	**(11,796,101.08)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ලැබීම්		
භාණ්ඩාගාර ප්‍රදාන(මානව සංවරධන හා ප්‍රාග්ධන)	154,996,000.00	13,700,000.00
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	-	2,000,000.00
ණය වාරික	10,821,267.62	5,818,070.70
වාහන විකුණුම්	15,919,907.00	-
සහස ඔප්පු ගාස්තු	186,000.00	29,500.00
සුභසාධක සංගමයේ ණය අය කිරීම්	-	720,000.00
ආපදා ණය	6,356,685.06	5,719,437.56
නා. ජ. ස. අ. සේවක නිවාස ණය අයකිරීම්	3,922,078.15	4,196,765.72
	192,201,937.83	32,183,773.98
වියදම්		
නිවාස ව්‍යාපෘති වියදම්	69,955,186.90	13,043,883.98
ව්‍යාපෘතිය නඩත්තු වියදම්	688,995.00	468,002.67
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	7,104,375.91	4,843,464.01
මානව සංවරධන වැඩසටහන	22,263,262.87	7,417,890.96
ආපදා ණය	2,250,000.00	4,747,500.00
අධ්‍යාපන ණය	236,250.00	102,500.00
අගුලාන අත්තිකාරම් නැවත ගෙවීම්	-	765,558.87
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	-	2,000,000.00
	102,498,070.68	33,388,800.49
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**89,703,867.15**	**(200,026.51)**

මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		
<u>ලැබීම්</u>		
කළමනාකරන සංස්ථා අරමුදල	22,342,000.00	249,500.00
	22,342,000.00	249,500.00
<u>වියදම්</u>		
අමාත්‍යාංශයට ආපසු ගෙවූ ප්‍රතිපාදන - හොරණ නිවාස ව්‍යාපෘතිය	-	364,684.59
අගුලාන කළමනාකරන සංස්ථා අරමුදල	412,000.00	289,500.00
	412,000.00	654,184.59
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**21,930,000.00**	**(404,684.59)**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	924,035,560.69	(12,400,812.18)
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	48,644,361.79	61,045,173.97
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**972,679,922.48**	**48,644,361.79**

සටහන - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ලංකා බැංකුව- බත්තරමුල්ල (පුනරාවර්තන) - ගිණුම් අංක:- 0010004252	26,734,169.33
ලංකා බැංකුව- බත්තරමුල්ල (ප්‍රාග්ධන) - ගිණුම් අංක:- 0071295541	13,494,230.95
ලංකා බැංකුව- බත්තරමුල්ල (අනුරාධපුර) - ගිණුම් අංක:- 0072703594	8,545,761.74
මහජන බැංකුව (ජංගම) - ගිණුම අංක:- 208100170047578	991,916.05
ඉතුරුම් ගිණුම - ගිණුම අංක:- 0072697157	6,403,752.55
ඉතුරුම් (IPG) - ලංකා බැංකුව - ගිණුම් අංක:- 87818698	10,091.86
ලංකා බැංකුව - ස්ථාවර තැන්පතු	903,500,000.00
මහජන බැංකුව - ස්ථාවර තැන්පතු	13,000,000.00
	972,679,922.48

ලංකා බැංකුව- බත්තරමුල්ල (පුනරාවර්තන) ගිණුම් අංක:- 0010004252

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තරය	ආරම්භක ශේෂය		ප්‍රවරථන වරුෂය තුල සිදු වූ වෙනස්කම්				අවසන් ශේෂය (රු)	
	2020	2021	2020		2021		2020	2021
			එකතු කිරීම්	අඩු කිරීම්	එකතු කිරීම්	අඩු කිරීම්		
මූලික ප්‍රාග්ධනය ගිණුම	-	-	-	-	-	-	-	-
ඒකාබද්ධ අරමුදල	12,065,000.00	6,641,977.00	-	5,423,023.00	-	-	6,641,977.00	6,641,977.00
භාණ්ඩාගාර ප්‍රදාන	2,028,343,051.71	1,993,016,243.85	-	35,326,807.86	125,016,000.00	1,401,922,419.67	1,993,016,243.85	716,109,824.18
රජය ප්‍රදාන ගිණුම	66,668,000.18	68,332,962.51	3,204,980.34	1,540,018.01	46,380,830.70	6,678,953.30	68,332,962.51	108,034,839.91
ස්ථාවර වත්කම් සඳහා	4,431,961.38	5,300,102.84	2,700,000.00	1,831,858.54	3,000,000.00	2,554,227.53	5,300,102.84	5,745,875.31
මානව සංවර්ධන වැඩස	6,285,000.00	6,285,000.00	-	-	-	-	6,285,000.00	6,285,000.00
ආදායම් සංචිත ගිණුම	34,500,000.00	36,625,000.00	2,125,000.00	-	-	-	36,625,000.00	36,625,000.00
ප්‍රත්‍යාගණන සංචිත	-	39,318,995.55	39,318,995.55	-	-	59,850.00	39,318,995.55	39,259,145.55
සමුච්චිත අරමුදල්	95,495,953.88	97,666,409.77	2,170,455.89	-	784,619,371.09	-	97,666,409.77	882,285,780.86
එකතුව	**2,247,788,967.15**	**2,253,186,691.52**	**49,519,431.78**	**44,121,707.41**	**959,016,201.79**	**1,411,215,450.50**	**2,253,186,691.52**	**1,800,987,442.81**

මූල්‍ය ප්‍රකාශන සටහන්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සටහන්
2021/12/31 දිනට මුදල් සහ බැංකු ශේෂය

සටහන
01

රු		රු
2020		**2021**
8,895,287.62	ලංකා බැංකුව බත්තරමුල්ල(පුනරාවරථන) ගිණුම අංක - 0010004252	26,734,169.33
6,891,827.31	ලංකා බැංකුව බත්තරමුල්ල(ප්‍රාග්ධන) ගිණුම් අංක - 0071295541	13,494,230.95
18,113,027.36	ලංකා බැංකුව බත්තරමුල්ල(අනුරාධපුර) ගිණුම් අංක- 0072703594	8,545,761.74
-	මහජන බැංකුව(ජංගම) ගිණුම් අංක - 208100170047578	991,916.05
14,523,411.19	ඉතුරුම් ගිණුම් අංක - 0072697157- ලංකා බැංකුව	6,403,752.55
220,808.31	කළමනාකරණ සංස්ථා ඉතුරුම් ගිණුම් අංක - 0076710959	-
-	ඉතුරුම් ගිණුම් (IPG) ගිණුම් අංක- 87818698 ලංකා බැංකුව	10,091.86
48,644,361.79		**56,179,922.48**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
මුදල් අත්තිකාරම් ගිණුම

සටහන
02

රු		රු
2020	මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වූ අත්තිකාරම් ගෙවීම්	**2021**
12,500.00	ප්‍රභාෂ් කරුණාතිලක මහතා	-
-	ඒ.පී.එම්.පුෂ්පා මිය	68,820.32
-	පැතුම් සෙනෙවිරත්න	20,000.00
-	ඉරේෂා දරශනී	21,915.00
-	ආර්.ඒ.සුසන්ත	124,720.00
-	සුජීත් කුමාර	43,638.00
-	ආශා දිල්රුක්ෂි	17,500.00
10,000.00	රොෂාන් අගම්පොඩි	-
12,800.50	එම්.ඩී.යූ.කෝරාල	-
20,000.00	ටී.ඩී.පී.රාජපක්ෂ	-
-	නන්දන ප්‍රේමසාර	24,743.00
55,300.50		321,336.32
750.00	සුළු මුදල්	750.00
56,050.50		322,086.32

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
ලැබිය යුතු ගිණුම

සටහන 03	රු		රු
	2020		**2021**
	40,961,488.22	ලැබිය යුතු වාරික - දිරිය නිවාස ව්‍යාපෘතිය	45,024,857.04
	8,930,688.65	ලැබිය යුතු වාරික - ස්වශක්ති ණය	10,083,517.87
	5,548,655.66	ලැබිය යුතු වාරික- තුරුඉතුරුගම නිවාස ණය	4,348,553.16
	3,539,770.00	ලැබිය යුතු වාරික -මහන මැෂින්	3,476,644.00
	60,598,557.00	ලැබිය යුතු වාරික - අගුලාන නිවාස ව්‍යාපෘතිය	71,575,935.00
	282,706.52	ලැබිය යුතු වාරික - අගුලාන (විකුණුම්) නිවාස ව්‍යාපෘතිය	342,541.14
	3,182,000.00	ලැබිය යුතු වාරික- සිංහපුර (බදු) නිවාස ව්‍යාපෘතිය	3,877,000.00
	11,230,695.62	ලැබිය යුතු වාරික- රඹගම නිවස ව්‍යාපෘතිය	14,861,101.42
	7,166.41	ලැබිය යුතු වාරික - හලාවත	16,446.37
	-	සෙවණ අරමුදල	-
	29,851,676.97	ලැබිය යුතු වාරික- වදුල්ලවත්ත නිවස ව්‍යාපෘතිය	31,206,760.89
	928,829.37	ලැබිය යුතු වාරික-සහස්පුර (පුනස්ථාපන) නිවස ව්‍යාපෘතිය	750,597.97
	11,179,694.38	ලැබිය යුතු වාරික-සහස්පුර (විකුණුම්) නිවස ව්‍යාපෘතිය	11,490,092.31
	7,808,556.33	ලැබිය යුතු වාරික-සිංහපුර නිවස ව්‍යාපෘතිය	8,040,597.78
	918,915.50	ලැබිය යුතු වාරික-තලවකැලේ (පුනස්ථාපන) නිවස ව්‍යාපෘතිය	875,230.50
	587,308.80	ලැබිය යුතු වාරික-තලවකැලේ (විකුණුම්) නිවස ව්‍යාපෘතිය	799,540.40
	185,556,709.43		206,769,415.85
	(9,277,835.47)	අඩමාණ ණයවෙන් කිරීම	(10,338,470.79)
	176,278,873.96		**196,430,945.06**
	-	ලැබිය යුතු වාරික - ලුනාව මධ්‍යම ආදායම් නිවස ව්‍යාපෘතිය	238,315,000.00

1,241,567.01	ලැබිය යුතු වාරික - නා.ඡ.ස.අ. සේවක ණය	585,107.15
615,298.01	ලැබිය යුතු වාරික - ආපදා ණය	305,012.31
2,011.97	ලැබිය යුතු නිවාස සංවරධන අධිකාරි ගිණුම	2,011.97
-	ලැබිය යුතු ස්ථාවර තැම්පතු පොළී	7,265,926.03
-	උත්සව අත්තිකාරම් - ලංකා බැංකුව	31,416.54
248,706.33	ලැබිය යුතු වරාය නගරය ව්‍යාපෘති ගිණුම	-
178,386,457.28		**442,935,419.06**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
ඉදිකිරීම් අත්තිකාරම්

සටහන 04	රු		රු
	2020		**2021**
	-	අගුලාන නිවාස ව්‍යාපෘතිය	-
	2,260,419.98	අගුලාන ප්‍රජා ශාලා ඉදිකිරීම සඳහා අත්තිකාරම්	1,323,113.95
	23,822.00	සම්පත් මධ්‍යස්ථානය සඳහා අත්තිකාරම්	-
	1,186,036.64	ශ්‍රී විමලසිරි පෙර පාසල සඳහා අත්තිකාරම් (SD&CC)	-
	3,470,278.62		**1,323,113.95**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
සම්පත් මධ්‍යස්ථාන තොග

සටහන 05	රු		රු
	2020		**2021**
	332,549.00	ලී බඩු	332,549.00
	60,562.50	ප්ලාස්ටික් පුටු	60,562.50
	293,994.00	පරිගණක	293,994.00
	687,105.50		**687,105.50**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
ලුනාව නිවාස ව්‍යාපෘතියේ තොග

සටහන 06	රු		රු
	2020		**2021**
		වාණිජ ඒකක	55,692,706.88
		බහුකාරය පරිශ්‍ර	15,692,727.41
		ප්‍රජා ශාලාව	13,158,750.74
		දිවා සුරැකුම් මධ්‍යස්ථානය	5,094,513.19
		පෙර පාසල	4,972,503.83
			94,611,202.05

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
ආයෝජන

සටහන 07	රු 2020		රු 2021
		ලංකා බැංකු ගිණුම් අංක:	
		87037855	61,000,000.00
		87097060	14,500,000.00
		87970167	12,000,000.00
		58022114	68,000,000.00
		88028098	25,000,000.00
		88028123	14,000,000.00
		88049259	27,000,000.00
		88061774	20,000,000.00
		88068135	10,000,000.00
		88074860	45,000,000.00
		88080707	50,000,000.00
		88085795	33,500,000.00
		88091784	12,000,000.00
		88097399	38,500,000.00
		88103926	11,000,000.00
		88109660	20,000,000.00
		88122188	10,000,000.00
		88122255	41,000,000.00
		88122244	13,000,000.00
		88129345	20,000,000.00
		88139699	10,000,000.00
		88151281	80,000,000.00
		88164882	27,000,000.00
		88190191	20,000,000.00
		88195623	25,000,000.00
		88213621	20,000,000.00
		88239012	30,000,000.00
		88244193	7,000,000.00
		88266486	25,000,000.00
		88271345	20,000,000.00
		88306240	24,000,000.00
		88313586	70,000,000.00
		මහජන බැංකුව ගිණුම් අංක:	
		2086001000284320	13,000,000.00
			916,500,000.00

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
ණය තොගය

සටහන 08	රු		රු
	2020		**2021**
	65,069,779.04	තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘති ණය	66,017,083.13
	278,619,592.00	අගුලාන නිවාස ව්‍යාපෘති ණය	267,210,064.00
	7,535,726.31	දිරිය නිවාස ව්‍යාපෘති	1,917,855.53
	316,964.00	මහන මැෂින් ණය	252,991.00
	1,798,673.32	ස්වශක්ති මානව සංවරධන ණය	1,719,593.76
	3,656,154.85	හම්බන්තොට නිවාස ව්‍යාපෘති ණය	3,554,859.85
	-	හලාවත නිවාස ව්‍යාපෘති ණය	-
	3,217,478.80	අගුලාන (විකුණුම්) නිවාස ව්‍යාපෘති ණය	3,131,246.05
	36,919,295.07	රජ්ගම නිවාස ව්‍යාපෘති ණය	34,605,773.31
	23,541,070.66	හලාවත නිවාස ව්‍යාපෘති ණය	22,818,017.48
	3,828,005.65	වදුල්ලවත්ත (විකුණුම්) නිවස ව්‍යාපෘතිය	2,150,553.45
	99,761.37	වදුල්ලවත්ත (පුනස්ථාපන) නිවස ව්‍යාපෘතිය	34,037.66
	3,660,488.50	සහස්පුර (විකුණුම්) නිවස ව්‍යාපෘතිය	2,820,210.22
	1,581,539.82	සිංහපුර (විකුණුම්) නිවස ව්‍යාපෘතිය	1,200,626.39
	1,579,684.49	සිංහපුර (පුනස්ථාපන) නිවස ව්‍යාපෘතිය	1,241,269.49
	16,345,312.50	තලවකැලේ (පුනස්ථාපන) නිවස ව්‍යාපෘතිය	15,967,000.00
	4,644,249.09	තලවකැලේ (විකුණුම්) නිවස ව්‍යාපෘතිය	4,401,165.69
	452,413,775.47		**429,042,347.01**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
කෙරීගෙන යන වැඩ

සටහන 09	රු		රු
	2020		**2021**
	-	අගුලාන නිවාස ව්‍යාපෘතිය	
	6,396,290.69	අගුලාන ප්‍රජා ශාලාව	6,747,972.83
	1,258,683,450.20	ලුනාව නිවාස ව්‍යාපෘතිය	-
	8,796,263.81	හොරණ නිවාස ව්‍යාපෘතිය	-
	1,885,411.50	මහයියාව නිවාස ව්‍යාපෘතිය	1,885,411.50
	15,108.24	බඹරකැලේ නිවාස ව්‍යාපෘතිය	15,108.24
	54,000.00	තුඩුවේගොඩ නිවාස ව්‍යාපෘතිය	564,909.00
	54,000.00	නාවලපිටිය නිවාස ව්‍යාපෘතිය	54,000.00
	-	මාලිගාවත්ත නිවාස ව්‍යාපෘතිය	2,042,839.80
	-	ඔරවඩ වත්ත නිවාස ව්‍යාපෘතිය	1,556,752.80
	-	ශ්‍රී ජයවරධනපුර කෝට්ටේ නිවාස ව්‍යාපෘතිය	355,000.00
	1,275,884,524.44		**13,221,994.17**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
දේපල පිරියත හා උපකරණ

සටහන **10**

(රු.)

වත්කම්	2021/01/01 දිනට ශේෂය	වරෂය තුල එකතු කිරීම්	වරෂය තුල ඉවත් කිරීම් / ගැලපීම්	2021/12/31 දිනට ශේෂය	2021/01/01 දිනට සමුච්චිත ක්ෂය	2021 වරෂයේ ක්ෂය	ඉවත් කල වත්කම්හි සමුච්චිත ක්ෂය	2021/12/31 දිනට සමුච්චිත ක්ෂය	2021/12/31දිනට ශේෂය
ඉඩම්	11,764,869.46			11,764,869.46		-	-	-	11,764,869.46
ගොඩනැගිලි	5,616,002.54	1,377,000.00		6,993,002.54	234,599.13	301,360.81	-	535,959.94	6,457,042.60
ලී බඩු හා සවිකිරීම්	2,406,678.46	1,581,856.89		3,988,535.35	44,165.87	635,817.13		679,983.00	3,308,552.35
කාරයාලීය උපකරණ	4,728,362.13	3,917,134.72		8,645,496.85	99,503.42	1,639,642.03		1,739,145.45	6,906,351.40
වාහන	30,190,000.00		8,490,000.00	21,700,000.00	2,540,579.23	5,565,550.68	1,940,009.70	6,166,120.21	15,533,879.79
පරිගණක	11,547,519.28	1,800,365.00		13,347,884.28	105,368.79	6,105,780.18		6,211,148.97	7,136,735.31
එකතුව	**66,253,431.87**	**8,676,356.61**	**8,490,000.00**	**66,439,788.48**	**3,024,216.44**	**14,248,150.83**	**1,940,009.70**	**15,332,357.57**	**51,107,430.91**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
උපචිත වියදම්

සටහන 11	රු		රු
	2020		**2021**
	285,235.00	නීති ගාස්තු	89,500.00
	10,464.10	ගමන් වියදම්	27,876.10
	-	පුවත්පත් වියදම්	3,150.00
	1,636,539.00	ලිපි ද්‍රව්‍ය වියදම්	581,799.26
	174,042.75	දුරකථන බිල්පත් ගාස්තු	97,827.35
	-	ප්‍රවාහන වියදම්	187,769.00
	-	අතිකාල දීමනා	584,913.79
	46,000.00	ආරක්ෂණ වියදම්	30,500.00
	126,871.11	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු වැටුප්	126,871.11
	15,372,284.12	කාරයාල කුලිය	27,387,188.66
	79,812.00	පිරිසිදු කිරීමේ වියදම්	-
	55,400.00	අනෙකුත් වියදම්	265,300.00
	3,480,106.29	ස්වශක්ති මානව සංවරධන	2,694,775.50
	-	ලී බඩු හා සවිකිරීම්	28,000.00
	300,000.00	ඉන්ධන වියදම්	584,455.29
	1,053,701.66	සේ.අ.සා අරමුදල	1,279,834.55
	-	සේ.නි.හා අරමුදල	1,226.70
	(25.00)	වාහන (අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)	1,201,250.00
	-	කාරයාල උපකරණ(අලුත්වැඩියාව හා නඩත්තු වියදම්)	181,250.00
	661.10	ණය අයකිරීම් කොමිස් ගෙවීම්	0.00
	101,520.00	ප්‍රචාරණ වියදම්	74,925.00

944,335.00	මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම	-
961,040.00	විගණන ගාස්තු	1,961,040.00
160,898.40	උපචිත භාරණ නිවාස ව්‍යාපෘතිය	-
11,607.00	ගෙවිය යුතු මුද්දර ගාස්තු	12,675.00
12,203,183.21	උපචිත ලුනාව නිවාස ව්‍යාපෘතිය	74,345,095.46
84,485.00	උපචිත අනෙකුත් සේවා	-
500,000.00	උපචිත ගිණුම්කරණ පැකේජය	250,000.00
383.76	උපචිත ජල බිල්පත් ගාස්තු	1,732.30
-	උපචිත සුභසාධන වියදම්	112,900.00
-	උපචිත උත්සව වියදම්	101,950.00
-	උපචිත ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු වියදම්	5,900.00
-	උපචිත පුහුණු කිරීමේ වියදම්	24,500.00
-	උපචිත මුද්‍රණ වියදම්	13,000.00
-	ශ්‍රී වික්‍රමපුර වියදම්	69,172.76
-	තුඩුවේගොඩ නිවාස ව්‍යාපෘතිය	127,278.00
-	වැලිසර නිවාස ව්‍යාපෘතිය	285,105.00
-	උපචිත පරිගණක අලුත්වැඩියාව හා නඩත්තු වියදම්	66,480.00
	ඔරවඩ වත්ත නිවාස ව්‍යාපෘතිය	24,800.00
37,588,544.50		**112,830,040.83**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
රදවා ගැනීම් - ඉදිකිරීම්

සටහන 12	රු		රු
	2020		2021
	-	රදවා ගැනීම් - ශ්‍රී විමලසිරිපෙර පාසල	172,652.61
	585,623.89	රදවා ගැනීම් - අගුලාන ප්‍රජා ශාලාව	-
	110,561.40	බඹරකැලේ නිවාස ව්‍යාපෘතිය	-
	52,686.27	රදවා ගැනීම්-සම්පත් මධ්‍යස්ථානය	23,522.57
	67,999.66	රදවා ගැනීම් - තලවකැලේ	0.05
	445,199.43	රදවා ගැනීම් - ගොඩනැගිලි අලුත්වැඩියා	76,852.52
	6,750.00	අනුරාධපුර සම්පත් මධ්‍යස්ථානය	-
	75,821.00	හොරණ නිවාස ව්‍යාපෘතිය	-
		රදවා ගැනීම් - සී සී ටීවී පද්ධති සවිකිරීම්	32,794.85
	1,344,641.65		**305,822.60**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
භාණ්ඩාගාර ප්‍රදාන

සටහන 13	රු		රු
	2020		2021
	421,263,715.65	අගුලාන නිවාස ව්‍යාපෘතිය	421,263,715.65
	1,267,316,673.63	ලුනාව නිවාස ව්‍යාපෘතිය	
	90,000,000.00	දිරිය නිවාස ව්‍යාපෘතිය	90,000,000.00
	60,541,000.00	හලාවත නිවාස ව්‍යාපෘති	60,541,000.00
	40,615,893.59	ලිදුල- තලවකැලේ නිවාස ව්‍යාපෘති	39,830,853.42
	2,409,839.96	සීතාවක නිවාස ව්‍යාපෘති	2,409,839.96
	8,804,705.87	හොරණ නිවාස ව්‍යාපෘතිය	-
	42,850,524.15	රත්ගම නිවාස ව්‍යාපෘති	42,850,524.15
	619,532.50	මහයියාව නිවාස ව්‍යාපෘති	619,532.50
	58,594,358.50	තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘති	58,594,358.50
	1,993,016,243.85		**716,109,824.18**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
ස්ථාවර වත්කම් සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන

සටහන 14

2020 රු		2021 රු
4,431,961.38	ආරම්භක ශේෂය	5,300,102.84
2,700,000.00	එකතු කිරීම්- වරෂයේ ලද ප්‍රදාන	3,000,000.00
(1,831,858.54)	අඩු කිරීම්- වරෂයේ ක්ෂය	(2,554,227.53)
5,300,102.84	අවසාන ශේෂය	**5,745,875.31**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
රාජ්‍ය ප්‍රදාන

සටහන 15

2020 රු		2021 රු
6,000,000.00	අමාත්‍යාංශයෙන් ලද මෝටර් වාහන (GU-1502)	-
29,701,963.36	වදුල්ලවත්ත (විකුණුම්)නිවාස ව්‍යාපෘතිය	29,701,963.36
1,826,865.26	වදුල්ලවත්ත (පුනස්ථාපන)නිවාස ව්‍යාපෘතිය	1,826,865.26
1,387,960.77	සහස්පුර (පුනස්ථාපන)නිවාස ව්‍යාපෘතිය	1,387,960.77
15,012,002.32	සහස්පුර (විකුණුම්)නිවාස ව්‍යාපෘතිය	15,012,002.32
3,734,709.68	සිංහපුර (විකුණුම්)නිවාස ව්‍යාපෘතිය	3,734,709.68
7,504,498.79	සිංහපුර (පුනස්ථාපන)නිවාස ව්‍යාපෘතිය	7,504,498.79
1,053,164.87	නාගරික සංවරධන අමාත්‍යාංශයෙන් ලද වත්කම්	1,978,042.27
2,111,797.46	ඉඩම් -අනුරාධපුර	2,111,797.46
-	සහස්පුර වානිජ ඒකක ගිණුම	44,777,000.00
68,332,962.51	ශේෂය	**108,034,839.91**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
මූල්‍ය කාරය සාධන වාරතාව සඳහා වූ සටහන්
පොළී ආදායම

සටහන16 - (අ)

සටහන16	රු.		රු.
	2020		**2021**
	439,004.08	ආපදා ණය පොළී ගිණුම	439,928.95
	1,059,867.30	දිරිය නිවාස ණය අයකිරීම් පොළී ගිණුම	600,277.44
	598,937.99	තුරුඉතුරුගම නිවාස ණයඅයකිරීම් පොළී ගිණුම	1,137,804.09
	346,520.33	නා.ඡ.ස.අ.සේවක ණය පොළී	209,688.76
	323,571.80	ස්වශක්ති නිවාස ණය අයකිරීම් පොළී	66,512.66
	159,672.32	අගුලාන (විකුණුම්) නිවාස ණය අයකිරීම් පොළී	91,900.87
	1,907,568.89	රජ්ගම නිවාස ණය අයකිරීම් පොළී	1,752,857.04
	935,315.61	වදුල්ලවත්ත නිවාස ණය අයකිරීම් පොළී	937,535.31
	262,534.76	සහස්පුර (විකුණුම්)නිවාස ණය අයකිරීම් පොළී	245,799.08
	272,841.29	සිංහපුර (පුනස්ථාපන) නිවාස ණය අයකිරීම් පොළී	94,586.76
	238,522.10	සිංහපුර (විකුණුම්) නිවාස ණය අයකිරීම් පොළී	190,578.49
	-	තලවකැලේ නිවාස ණය අයකිරීම් පොළී	226,648.20
	6,544,356.47		**5,994,117.65**

සටහන16 - (ආ)

521,762.10	පොළී ආදායම - ඉතිරි කිරීමේ ගිණුම් -: ගිණුම් අංක - 0072697157	146,218.83
21,298.37	පොළී ආදායම - අගුලාන කළමනාකරණ සංස්ථා අරමුදල ඉතිරි කිරීමේ ගිණුම් -: ගිණුම් අංක - 0076710959	553.58
-	පොළී ආදායම -ඉතිරි කිරීමේ ගිණුම (IPG) - 87818698	91.86
-	ස්ථාවර තැන්පතු පොළී ආදායම	15,988,255.51
543,060.47		**16,135,119.78**
7,087,416.94		**22,129,237.43**

සටහන**17**

නාගරික ජනාවාස සංවරධන අධිකාරිය
අනෙකුත් ආදායම්

රු.		රු.
2020		**2021**
1,022,278.44	විවිධ ආදායම්	369,548.02
780,000.00	සිංහපුර කුළී ආදායම	780,000.00
19,000.00	ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු තැන්පතු	291,000.00
92,150.00	ශ්‍රී වික්‍රමපුර ප්‍රජා ශාලා ආදායම	48,050.00
49.00	අධිභාර ගිණුම	56,083.78
29,500.00	සහස ඔප්පු ගාස්තු	65,070.00
110,748.78	ආපසු ලද අධ්‍යාපන ණය මුදල්	-
960,000.00	ලුනාව පෙරසැරි ගාස්තුව	632,000.00
-	අපහරණ අයිතම විකුණුම්	772,752.00
-	අනුරාධපුර පෙරසැරි ගාස්තුව	14,500.00
-	විමරෂන මගින් ලැබීම්	51,446.76
-	රීල් සමාගමෙන් ලද ආදායම	2,656,005.39
3,013,726.22		**5,736,455.95**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HUD/C/USDA/FA/21/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022ජූලි27දින

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනසහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි සඳහන් නියමයන්ට පටහැනිව වටිනා මාස 6 කින් සහ මාස 12 කින් කල්පිරෙන රු.524,500,000 ක්වූ ස්ථාවර තැන්පතුවල අගයන්ද මුදල් හා මුදලට සමාන වටිනාකම් ලෙස අදාළ කර ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මුදල් සහ මුදලට සමාන වටිනාකම්ශේෂය එම අගයෙන් අධිගණනය වී තිබුණි. එසේම, අධිකාරිය විසින්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සමාලෝචිත වර්ෂය තුළදි ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන ලද රු.916,500,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 8.4 අනුව පිරිවැය රු.මිලියන 4.9 ක් වූ අනුරාධපුර තුරු ඉතුරුගම නිවාස 6 ක් සංචාරක බංගලා වශයෙන් පත්වාගෙන යනු ලබන බව දක්වා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 "දේපළ පිරියත හා උපකරණ" හි වගන්ති අංක 7 අනුව එම නිවාස ආයෝජන දේපලක් ලෙස හඳුනා නොගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. එමෙන්ම පිරිවැය රු. මිලියන 36.62 ක් වූ අධිකාරිය විසින් බදු පදනම මත ලබා දී ඇති සිංහපුර නිවාස 15 ක් ආයෝජන දේපළක් ලෙස හඳුනා නොගෙන ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලැබිය යුතු රු. මිලියන 206.77 ක මුළු ණය අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කර එහි හානි සම්පූර්ණ හානිකරන අගය හඳුනා ගැනීමට කටයුතු නොකර එම සම්පූර්ණ ශේෂයෙන් සියයට 5 ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම්හි ඇතුළත් රු. මිලියන 6.64 ක සමුච්චිත අරමුදල තුළ 2017 වර්ෂයේදී රේඛිය අමාක්‍යාංශයෙන් ලද රු. මිලියන 2.35 ක මෝටර් රථයක වටිනාකම් ඇතුළත් කර තිබූ අතර එම මෝටර් රථයේ වටිනාකම් රජයේ ප්‍රදානයක් ලෙස ගිණුම් ගතකර වාර්ෂිකව ක්‍රමක් ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂයකට වැඩි කාලයක් පවතින ශේෂයක් වූ ලුනාව නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලද රු. මිලියන 751.11 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි භාණ්ඩාගාර ප්‍රදාන යටතේ ගිණුම් ගත නොකර ජංගම වගකීම් යටතේ විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා හිමිකම් සහ සංචිත එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැකවුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ලුනාව නිවාස ව්‍යාපෘතියේ නිවාසවලින් නොවිකිණී ඉතිරි වූ නිවාස ඒකක ප්‍රමාණය 181ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල නිවාස තොගය ලෙස ඒකක 180 ක් දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.මිලියන 3.64 කින් ඌන ගණනය වී තිබුණි. එසේම විකුණන ලද නිවාස 175 ට අදාලව හඳුනාගත යුතු ආදායම රු.මිලියන 150.06 ක් වුවද එය රු.මිලියන 766.35 ක් ලෙස ගිණුම්ගත කිරීම

හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අදායම රු.මිලියන 616.29 කින් අඩිගණනය වී තිබුණි.

(ඇ) නිසි සකාහතා අධ්‍යනයකින් තොරව මහනුවර මහයියාව ප්‍රදේශයේ අක්කර 12 ක භූමි ප්‍රදේශයක අඩු පහසුකම් සහිත නිවාස 1220 ක් වෙනුවෙන් ස්ථිර නිවාස ඉදිකිරීම සඳහා සැළසුම් කළ ව්‍යාපෘතිය සඳහා නායයෑම් අවදානම් රහිත භූමිය අක්කර 04 කට සීමා වීම නිසා අධිකාරිය විසින් ව්‍යාපෘති කටයුතු අත්හැර දමා තිබු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් එතෙක් දරන ලද රු.1,855,411 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණද එය අධිකාරියේ ලාභයට එරෙහිව කපා නොහැර කෙරිගෙන යන වැඩ යටතේ ගිණුම්වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2021වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූමගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවනතොරතුරු, අනෙකුත් තොරතුරුයන්නෙන් අදහස් වේ. මෙමඅනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝමතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විටකියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින්ලබාගත් මගේ දැනුම අනුවප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත් සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන

සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සහාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ(ආ)

,(ඉ),(ඊ),(උ)ඡේදවලදක්වාඇතිනිරීක්ෂණහැරඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැරයම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ) 1971 අංක 38 දරන මුදල් පනත 11 (ආ) වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පත්වල රු. මිලියන 1,195 ක් ආයෝජනය කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ. 371 (2) (ආ)	• සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 13 කදී නිලධාරීන් 12 දෙනෙකු වෙත ලබා දී තිබුරු. 3,000 ත් රු.60,000 ත් අතර පරාසයකවූ එකතුව රු.218,000 ක විශේෂ අත්තිකාරම් මුදල් අදාළ කාර්යය සඳහා වියදම් කිරීමකින් තොරව දින 01 සිට දින 30 ක කාලයක් අත රදවාගැනීමෙන් පසුව නිරවුල් කර තිබුණි. • කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමට

කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි වලට පටහැනි අවස්ථා 07 කදී නිලධාරීන්ට රු.104,000 ත් රු.120,000 ත් අතර පරාසයක එකතුව රු.752,000 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 13 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. එසේම පනතේ 10 වන වගන්තිය අනුව අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වන විට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි.

  (ආ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (1) (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. සේවා ගාස්තු අයකිරීම නවතන අවස්ථාව වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබූ රු. මිලියන 207.33 ක සේවා ගාස්තු මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීමට අපොහොසත්ව තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 14.19 ක් වූ අඟුලාන සයුරපුර මහල් නිවාස සංකීර්ණයේ සුභසාධක ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කළ වැඩ වටිනාකම රු. මිලියන 5.85 ක්ව පැවතියදී කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී අත්හැර දමා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබූ වැඩ පූර්ව අත්තිකාරම්මුදලෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්අයවිය යුතුව පැවති රු.මිලියන 1.32 ක ශේෂය අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ආ) නිවාස ව්‍යාපෘති 02 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති කුලී ආදායම රු.75,462,935 ක් වූ එයින් වසර 1- 2ත් අතර කාලයක සිට අයවිය යුතු කුලී ආදායම රු. 12,079,528 ක් ද, වසර 2-5 ත් අතර කාලයක සිට අයවිය යුතු ශේෂය රු.34,769,303 ක් ද, වසර 5 ඉක්මවූ කාලයක සිට අයවිය යුතුව පැවති ශේෂය රු.16,384,576 ක් ද විය.

(ඇ) නිවාස ව්‍යාපෘති 05 කටසහ සහනදායී ණය යෝජනා ක්‍රම 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය වාරික මුදල රු.130,973,939 ක් වූ අතර එයින් වසර 1- 2ත් අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු.23,162,568 ක් ද, වසර 2-5 ත් අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු.50,610,420 ක් ද, වසර 5 ට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවති ශේෂය රු.35,166,939ක් ද විය.

(ඈ) සෙත්සිරිපායේ පිහිටි කාර්යාල පරිශ්‍රය සඳහා ගෙවීම් අත්හිටුවා තිබූ නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු කාර්යාල කුලිය ඉකුත් වර්ෂයේ සිට නැවත ගෙවීම් කිරීම ආරම්භ කර තිබුණද 2016 වසර සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හිඟ හිටි කාර්යාල කුලිය රු.මිලියන 27.39 ක් විය.

(ඉ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී නොතිබුණි.

(ඊ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් නිම කළ නිවාස යෝජනාක්‍රම 03 ක හා ඉදිකරමින් පවතින නිවාස යෝජනාක්‍රම එකක පවතින නිවාස ඒකක 512 කට අදාල හෙක්ටයාර් 2.21 ක ඉඩම් අදාල ආයතනවලින් පවරා ගැනීම අවසන් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් ඉදිකර අයිතිය හාර දී ඇති නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(උ) අධිකාරිය විසින් අහුලාන නිවාස ක්‍රමයෙහි පැවැති රු.මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක් මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් 2016 සැප්තැම්බර් 26 සිට 2019 පෙබරවාරි 12 අතර කාලය තුළ භුක්තිය ලබාදී තිබුණ නමුත් සාධාරණ මුදලක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට 2019 සැප්තැම්බර් 18 දිනැති හා අංක අමප/අංක/19/2761/122/085 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පසුව සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු මුදලක් අධිකාරිය අයකරගෙන නොතිබුණු අතර නිවාස සඳහා මුදලක් අයකිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ලබා ගැනීමට පෙර නිවාස ලබාදී තිබීම මේ සඳහා හේතුවී තිබුණි. අධිකාරිය නිවාස ලාභීන් සමඟ ගිවිසුම් ගතවීමටද කටයුතු කර නොතිබුණු අතර මෙම නිදහස් දීමනා අතර අධිකාරියේ අරමුණෙන් බැහැරව ක්‍රීඩා සහ රංගන කේෂ්ත්‍රවල නිතර පුද්ගලයින්ටද නිවාස ලබාදී තිබුණි.

(ඌ) සීමාසහිත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම අධිකාරියට පවරා ගැනීමේදි සිදුව තිබූ මූල්‍ය වංචාවට අදාළව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින ලබාදුන් උපදෙස් අනුව අලාභය සම්බන්ධව අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු කටයුතු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා මුදල් රෙගුලාසි 103 (පරිච්ඡේද II) යටතේ අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඒ සම්බන්ධව වගකිව යුතු පුද්ගලයින් හා රජයට සිදුවී ඇති අලාභය නිවැරදිව ගණනය කළ යුතුව ඇති බව සඳහන් වුවද රේඛීය අමාත්‍යාංශය ඒ පිළිබඳ ඉදිරි කටයුතු 2022 ජූනි වන විටත් සිදුකර නොතිබුණි.

(එ) අධිකාරියේ සභාපතිවරයාගේ රාජකාරී කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය විසින් 2020 ජූලි 15 වන දින ලබා දී තිබූ නිල රථය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ ඉල්ලීමට අනුව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරන ලද අධිකාරියේ හිටපු සභාපතිවරයා වෙත නිදහස් කර තිබූ අතර පසුව එම වාහනය අධිකාරිය වෙත ලබා දී තිබුණද එහි නීත්‍යානුකූල හිමිකම 2022 ජූලි වන විටත් අධිකාරිය වෙත පවරා දී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති